# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 මාර්තු 24 වන දින

❖ 08 වන සැසි වාරයේ 47 වන සභා වාර්තාව

දිනය :- 2022.03.24 වන දින

වේලාව :- පෙ.ව.10.00

ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය

**පැමිණීම**

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ඒ. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු ප්‍රා.ස.මි. ජේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා. ස. මි. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.මි. ඩබ්.ඩී.එම්.බී. හරිශ්චන්ද්‍ර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.මි. එම්.පී.සී.කැළුම් තුෂාර ගුරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.මි. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.මි. ජේ.වී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.මි. එම්.ඩී. ප්‍රසාදශ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.මි. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.මි. මාතෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.මි. ජේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.මි. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.මි. ජේ. රන්ජන් වීරසේකර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.මි. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.මි. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.මි. ජී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.මි.එච්.ජේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.මි. ප්‍රගත් කරඹගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.මි. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 20.ගරු ප්‍රා.ස.මි. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |

21. ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා. පෙ.ව. 10.00

22. ගරු ප්‍රා.ස.ම. රමණි ගල්ලෙප ගමගේ මැතිතුමිය. පෙ.ව. 10.00

23. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය. පෙ.ව. 10.00

24. ගරු ප්‍රා.ස.ම. එන්.ඒ.එස්. විරසිරි මැතිතුමිය. පෙ.ව. 10.00

25. ගරු ප්‍රා.ස.ම. කේ.කේ. පී.සුමේත්‍රා මැතිතුමිය පෙ.ව. 10.00

**නොපැමිණීම**

01. ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා

02. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා.

03. ගරු ප්‍රා.ස.ම. සිරිශාන්ත මහවිටගේ මැතිතුමා

04. ගරු ප්‍රා.ස.ම. ඊ.සී. ඉන්දික මැතිතුමා.

**සහභාගී වූ නිලධාරීන්**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුෂිත් රන්දුල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරී - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණ සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම් සිහි කරන ලදී. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින පැවැත්වෙන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ මාර්තු මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වූ ගරු හිටපු සභාපතිතුමා , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන්, මාධ්‍යවේදීතුමන්ලත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**නවක මන්ත්‍රීතුමියගේ දිවුරුම් දීම**

දැනට මාස කිහිපයකට පෙර අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමියක වන ජේ. චන්ද්‍රලතා මැතිතුමිය හදිසියේ අභාවයට පත් වීම නිසා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් නවක මන්ත්‍රීතුමියක ලෙස ජේ.කේ.පී.සුමේත්‍රා මැතිතුමිය ඒ සඳහා තෝරා පත් කර ඇති බව මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් ගැසට් නිවේදනයක් මගින් අප වෙත දැනුම් දී තිබෙනවා. ඒ අනුව එතුමියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීධුරයෙහි දිවුරුම් දීම සඳහා ආරාධනා කරමු යයි ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ. පී.සුමේත්‍රා මැතිතුමිය විසින් දිවුරුම් දීමෙන් අනතුරුව නව ආසනයේ අසුන් ගනිමින් සභික ධුරයෙහි වැඩ භාර ගන්නා ලදී.

## 01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2022 පෙබරවාරි මස 17 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා යැයි සලකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.රමණී හල්පෙගමගේ මැතිනිය**

ගරු සභාපතිතුමණි, මෙම වාර්තාවේ සඳහන් පරිදි 30 වන පිටුවේ තිබෙන අනුමත කිරීමේදී මගේ නම සඳහන් වෙනවා. එය සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි එය සංශෝධනය කරමු.

නිහඬතාවයෙන් පෙනී යන්නේ තවදුරටත් පසුගිය සභා වාර්තාවේ සංශෝධන නොමැති බවයි. ඒ අනුව සංශෝධන සහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 පෙබරවාරි මස 17 වන දින පැවති මහ සභා රැස්වීමේ සංශෝධිත වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන - නැත

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

### 04-01. කිරම නගරයේ මාර ගස ඉවත් කිරීම සම්බන්ධ ප්‍රශ්ණ
( ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා)

ප්‍රශ්ණ අංක 01 - වසර දහස් ගණනක් කිරම නගරයට සෙවණ දුන් පොළ භූමිය අසළ පිහිටි ඉතා වටිනා මාර ගස ඉවත් කිරීමට හේතුව කුමක්ද?

පිළිතුර -( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා)

මෙම ගස වසර 58ක් පමණ පරණයි. ඒත් එක්කම මෙම පාර මාර ගස් වර්ගයෙහි වටිනාකම ඉතා අඩුයි. ඉතා වටිනා ලෙස අදහස් කිරීම කුමන අරමුණකින් කළේද යන්න ගැටළුවක්. මෙම ගස අනතුරු දායක ගසක් ලෙස බස් නැවතුම්පොළේ තමයි තිබුණේ. පොළ භූමිය තුළ නොවෙයි. එතන ජනතාව ගැවසෙනවා. බස් නැවතුම්පොලට බස් ඇතුළු කිරීමට අවහිර වන නිසා මෙම ගස ඉවත් කරන්න සිදු වුණා.

ප්‍රශ්ණ අංක 02 - මෙම ගස කපා ඉවත් කිරීමට කිසියම් හෝ වගකිව යුතු ආයතනයකින් අවසරයක් ලබා ගත්තේද?

පිළිතුර -( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා)

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 107 වගන්තිය ප්‍රකාරව අනතුරුදායක ගස් සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය ප්‍රාදේශීය සභාව වන නිසා වෙනත් ආයතනයකින් අවසරයක් අවශ්‍ය නැහැ.

ප්‍රශ්න අංක 03 - මෙම ගස කපා ඉවත් කිරීමට අදාළව තාක්ෂණික වාර්තාවක් ලබා ගත්තේද?

පිළිතුර - ( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා)

තාක්ෂණික වාර්තා පදනම් කරගෙන තමයි මේ ගස ඉවත් කළේ. මේ සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට තාක්ෂණික වාර්තා හා නිර්දේශ ඉදිරිපත් වී තිබෙනවා.

ප්‍රශ්න අංක 04 - මෙම ගසේ තිබූ වටිනා දැව කඳන් සහ දර වලට සිදු වූයේ කුමක්ද?

පිළිතුර -( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා)

මෙම ගස කපා ඉවත් කළ අයම දර ටික ඉවත් කළා. දැවමය වටිනාකමක් ඇති කඳන් ඉවත් කිරීමට අපි දැනට ඝන්මීටරුවක් අරගෙන තියෙනවා. අපිට ගස කපා ඉවත් කිරීමට වියදම් වූ මුදල් ලබා ගන්න මේ දැව ටික විකිණීම කළ යුතුයි. එම දැව දැනට කිරම ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට ගොඩ ගසා තිබෙනවා.

ප්‍රශ්න අංක 05 - විධිමත් ටෙන්ඩර් කැඳවීමක් කර මෙම ගස කපා ඉවත් කිරීමට කටයුතු කළේද?

පිළිතුර -( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා)

විධිමත් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරලා තමයි ගස ඉවත් කළේ.

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

### 05 – 1. පරිපූරක අයවැයක් ඉදිරිපත් කිරීම හා වියදම් සීමාවන් සංශෝධනය කිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

පරිපූරක අයවැයක් ඉදිරිපත් කිරීම හා වියදම් සීමාවන් සංශෝධනය කිරීම මැයෙන් 2022.03.09 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව 2022.01.01 දින සිට සියලුම රාජ්‍ය නිලධාරීන්ට සහ විශ්‍රාමිකයින්ට රු.5000.00ක දීමනාව ලබා දීම හේතුවෙන් පහත පරිදි 2022 වර්ෂය සඳහා අයවැය සංශෝධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

| වැඩ සටහන | ආදායම් ශීර්ෂය | වටිනාකම රු. |
|---|---|---|
| පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 1/70 | 156000.00 |
| සෞඛ්‍ය සේවා | 2/70 | 780000.00 |
| භෞතික සැළසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | 3/70 | 3000000.00 |

| | | |
|---|---|---|
| ජල සේවා | 4/70 | 600000.00 |
| පොදු උපයෝගිතා සේවා | 5/70 | 120000.00 |
| සුබ සාධන සේවා | 6/70 | 1140000.00 |
| එකතුව | | 7200000.00 |

වියදම් සංශෝධන දීමනාව

| වැඩ සටහන | වියදම් ශීර්ෂය | වටිනාකම රු. |
|---|---|---|
| පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 101 | 1620000.00 |
| සෞඛ්‍ය සේවා | 201 | 1560000.00 |
| භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | 301 | 3240000.00 |
| ජල සේවා | 401 | 600000.00 |
| පොදු උපයෝගිතා සේවා | 501 | 120000.00 |
| සුබ සාධන සේවා | 601 | 1140000.00 |
| එකතුව | | 8280000.00 |

ගරු ප්‍රා.ස.ම. එම්.ජයන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.01.01 දින සිට සියලුම රාජ්‍ය සේවකයින්ට චක්‍රලේඛයක් මගින් රු. 5000.00ක දීමනාවක් ලබා දීමට රජය තීරණය කිරීමත් සමඟ 2022 අයවැය සඳහා පරිපූරකයක් යොදා ගනිමින් එය සංශෝධනය කිරීමට සිදු වුණා.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ස්ථිර සේවකයින්ට මේ මුදල් ප්‍රතිපූර්ණය වෙනවා නේද? ආදේශක , කොන්ත්‍රාත් අයට පමණයි නේද සභා අරමුදලින් ගෙවීම් කරන්නේ?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්, අපිට මේ මුදල් ප්‍රතිපූර්ණය වෙනවා.

ඒ අනුව සියලුම රාජ්‍ය නිළධාරීන්ට සහ විශ්‍රාමිකයින්ට රු.5000.00ක දීමනාව ලබා දීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා අයවැය සංශෝධනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 2. කිරම පෙර පාසලෙහි පැති බැම්ම සහ සිවිලිම සකස් කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කිරම පෙර පාසලෙහි පැති බැම්ම සහ සිවිලිම සකස් කිරීම මැයෙන් පෙර පාසල් ගුරු එම්.ශ්‍රියානි හේමලතා මිය විසින් 2022.03.01 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කිරම පෙර පාසලෙහි වම් පස ඇති පැති බැම්ම සකස් කර දෙන ලෙසත් වහලයේ සිවිලිම දිරාපත්ව ඇති බැවින් එය

සකසා දෙන ලෙසත් ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිලධාරි වාර්තාවක් මත සභා අරමුදලින් එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මෙම පස් කන්ද කඩා වැටුණොත් පහළ පාසලට හානියක් වෙනවා. ඒත් එක්කම පාර යට වෙනවා. සිවිලිමත් ඉක්මණින් සකස් කළොත් ලොකු හානියක් වීම වළක්වන්න පුළුවන්. ඒ නිසා ඇස්තමේන්තුවක් හදලා මේ කටයුතු ඉක්මණින් කරමු.

ඒ අනුව කිරම පෙර පාසලෙහි වම් පස ඇති පැති බැම්ම සකස් කිරීම සහ ශාලාවේ සිවිලිම දිරාපත්ව ඇති බැවින් එය සකස් කිරීම සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදලින් එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 3. කිරම පොළ භූමියෙහි පිහිටි කඩ කාමර සම්බන්ධවයි</u>

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

කිරම පොළ භූමිය තුළ පිහිටි පැරණි කඩ කාමර මේ දිනවල කඩා ඉවත් කරන බැවින් එම කඩ කාමර වල හිමිකම් ප්‍රකාරව වෙළඳාම් කළ පැරණි කඩ හිමියන් සියලු දෙනා හට නව කඩ කාමර ලබා දීමේදී ප්‍රමුඛතාවය දීම සුදුසු බවත් වැඩිපුර කඩ කාමර තිබේ නම් අළුතින් ඉල්ලුම් කරන අයට ඒවා ලබා දීම සිදුවිය බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් පොදුවේ පිළිතුරක් ලබා දෙන්නම්. කිරම පරණ පොළේ කඩ කාමර ඉතා දිරාපත් මට්ටමක තමයි තිබුණේ. ඒ නිසා කමිටුවක් මගින් ඒ අයට බස් නැවතුම් පොළ බිම් මහලේ කඩ කාමර ලබා දෙන්නත් එතන ඉතිරි අයට පිරවුම් හල අසල කඩ කාමර තුනක් සකස් කර දෙන්නත් මේ තීරණයක් ගත්තා. ඒ සඳහා අයවැයෙන් මුදල් වෙන් කරලා තියෙනවා. දැනට අත්‍යවශ්‍ය අයට කඩ කාමර ලබා දීලා තියෙනවා. ඉතිරි අයට ඉක්මණින් සකස් කරලා දෙනවා. පමණක කඩ කාමර ලබා දීමේදී ගැටළුවක් මතු වුණා. එතන එක් අයෙක් පොල බිඩු එකතු කරන කෙනෙක් සහ ලී බඩු සාප්පුවක් ඇති අයෙක් ඉන්නවා. ඒ නිසා ඒ අයට වාහන පැමිණීම අපහසු නිසා වෙනත් ස්ථානයකින් සකස් කරලා දෙන්න කමිටුව මගින් තීරණයක් ගත්තා. වැඩි පුර කඩ කාමර මෙම ස්ථානයේ නැහැ. ඉන්ධන පිරවුම් හල අසල තමයි සකස් කරලා දෙන්න තියෙන්නේ. මාධ්‍ය මෙවදීනි ඩබ්.ජී. තෙල්කා මහත්මිය විසින් ගරු ආණ්ඩුකාරතුමන් මගින් අප වෙත ඉල්ලීම කරලා තියෙනවා කඩ කාමරයක් ලබා දෙන්න කියලා. ඉතිරි කඩ කාමර තියෙනවා නම් අවට මේ සම්බන්ධව අවධානය යොමු කරලා බලන්න වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

සභාපතිතුමණි, අළුතෙන් කඩ කාමර සකස් කරන්නේ සභා අරමුදලින්ද? ඒවා දෙන්නේ කාටද? දැනට නම් කරලද තියෙන්නේ? ඒ වගේම සුදුස්සන් අලෙවිසැළට දැනට ස්ථානයක් නැද්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පිවිසුම් හල අසළ තමයි මේ කඩ කාමර සකස් කරන්නේ. ගොඩක් බඩු අලෙවිසැලට සහ ලී බඩු සාප්පුවට ආදී ඉඩකඩ අවශ්‍ය අයට එතන දෙන්න පුළුවන්. පුවත්පත් අලෙවිසැලට වෙන් කරලා තියෙන ස්ථානයක් තියෙනවා. එතන සැලැස්මේ හැටියට කුඩා ඉඩක් තමයි වෙන් වෙලා තියෙන්නේ. එතන ඉඩ මදි නම් අදාළ කට්ටුවෙන් තමයි දෙන්න වෙන්නේ.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

එත් එක්කම ඔය කිරම පොළ කඩ කාමර ලබා දීමේදී පත්තර විකිණීම සඳහා වෙන් කරන ලද ස්ථානයක් තියෙනවා. මේ පත්තර කඩය ඉතා අතීත කාලයේ සිට කරගෙන එන්නක් . ස්වර්ණා තියන අය එදා ඉඳලම මේක කරගෙන ආවා. ඒ නිසා අසාධාරණයක් නොවෙන්න යම් ඉඩකඩක් ඇති ස්ථානයක් මේ සඳහා දෙන්න. පත්තරයක් ගන්න මිනිස්සු දුවගෙන එන්නේ හදිසියට. ඒ නිසා මේ සඳහා සාධාරණයක් ඉටු කරලා දෙන්න. එතන ඉඩක් නැත්නම් වෙනත් තැනකින් හදලා දීලා හරි අපි ගැටළු ඇති නොවෙන්න මේ කටයුත්ත කරමු. මේ කඩ කාමරය කරගෙන යන අය අපි එදා ඉඳලම දන්නවා. ඒ අය පිළිවෙළට ඒ කටයුත්ත කර ගෙන එනවා.

ඒ අනුව කිරම පොළ කඩ කාමර හිමියන් වෙත බස් නැවතුම් පොළ බිම මහලේ කඩ කාමර ලබා දීම සම්බන්ධව කමිටු තීරණයන් මගින් තෝරා ගන්නා අය සඳහා එම කඩ කාමර ගිවිසුම් ගතව ලබා දීම සුදුසු බවත් ඉතිරි අයට නව කඩ කාමර සභා අරමුදලින් සකස් කර දීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. කිරම පොදු වෙළඳපොළ කඩ කාමරයක් පැවරීම සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කිරම පොදු වෙළඳපොළ කඩ කාමරයක් පැවරීම සම්බන්ධවයි මැදයෙන් කිරම, වෙළඳගොඩ, සිතාරා ලිපිනයෙහි පදිංචි කමල් මහේන්ද්‍ර යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහු විසින් දැනට කරගෙන යනු ලබන කිරම පොදු වෙළඳපොළ අංක 06 කඩ කාමරය ඔහුගේ රෝගී තත්වය නිසා තවදුරටත් කර ගෙන යාමට නොහැකි බැවින් එය ඔහුගේ ඥාති සහෝදරියකට ලබා දීමට ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම, ජයවීරගොඩ, සිරිවෙද නිවස ලිපිනයෙහි පදිංචි ගොඩැල්ලගේ සන්ධ්‍යා උදේනි සඳරේඛා යන අය වෙත ද්/ප/පා/ගකා/2010 චක්‍රලේඛ ප්‍රකාරව එම කඩ කාමරය පැවරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ පුද්ගලයාට අසනීප තත්වය හේතුවෙන් කඩ කාමරය ඥාති සහෝදරියකට ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා. අපි චක්‍රලේඛ ප්‍රකාරව මේ කටයුත්ත කරමු.

ඒ අනුව කිරම, වෙළඳගොඩ, සිතාරා ලිපිනයෙහි පදිංචි කමල් මහේන්ද්‍ර යන අයට හිමි කිරම පොදු වෙළඳපොළ අංක 06 කඩ කාමරය කිරම, ජයවීරගොඩ, සිරිවෙද නිවස ලිපිනයෙහි පදිංචි ගොඩැල්ලගේ සන්ධ්‍යා උදේනි සඳරේඛා යන අය වෙත ද්/ප/පා/ගකා/2010 චක්‍රලේඛ ප්‍රකාරව පැවරීම

සම්බන්ධව විධායක අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 5. ප්‍රාදේශීය සභා පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම සම්බන්ධව 2022.03.09 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පහත නාම වලින් පිටපත් 02 බැගින් පුස්තකාල 04 සඳහා පිටපත් 16 බැගින් සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ටවර් හෝල් රඟහල පදනම විසින් නිෂ්පාදිත පොත් හා ප්‍රකාශන

01.ජෝන් ද සිල්වා ලිපි සරණිය
02.සතක සත්සර ටවර් ගී සරණිය
03.ජෝන් ද සිල්වා සහ සිංහල නාට්‍ය
04.ශූනෝර්
05.කවුරුත් එන්නේ නෑ
06.වෙස්සන්තර
07.ශ්‍රී වික්‍රම
08.සිරිසඟ බෝ
09.පණ්ඩුකාභය
10.විදුර
11.රොමලින් හෙවත් දිව්‍ය කුසුම්
12.පද්මාවතී
13.ශූලා හෙවත් කපටි බෑනා
14.ජෝන් ද සිල්වා කිවිවරයාණෝ
15.මිඩියා

- කඩු අකර දියවැල - බී.නිමාලි පෙරේරා , ප්‍රිය මාවත, මහුවදුව, පිළියන්දල
- බෞද්ධ රාජ්‍ය පරිපාලන මූලධර්ම සහ භාවිතය- චතුර කාරම්පනාව , 163/21, විමුක්ති මාවත, පිට්ටුගල, මාලඹේ
- ලංකා සිවිල් සේවය - ජේ.ඒ. තිලකරත්න, නො.40, බෞද්ධාලෝක මාවත, පිළියන්දල

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අවශ්‍ය නම් පුස්තකාල වලට අවශ්‍ය කෑලි තෝරලා දෙන්න කියන්න පුළුවන්.

**<u>ගරු ප්‍රා.ස.ම.ජේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>**

මේ කෑලි ටික ළමයින්ට අවශ්‍ය නම් අපි අරගෙන දෙමු. එය ලේඛකයා දිරිගැන්වීම සඳහාත් හේතු වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

එතරම් ලොකු මිල ගණන් වල කෑලි නොමැති නිසා අපිට ගැටළුවක් වෙන එකක් නැහැ.

ඒ අනුව ඉල්ලුම් කර ඇති පුස්තකාල පොත් වලින් පිටපත් 02 බැගින් පුස්තකාල 04 සඳහා පිටපත් 16 බැගින් සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදීත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 6. ජල බිල්පත් සඳහා සහන සැලසීම සම්බන්දව</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ජල බිල්පත් සඳහා සහන සැලසීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.03.15 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි සභාව මගින් පාලනය වන ජල ව්‍යාපෘතියට අයත් කළ ලිං, ජල ටැංකි හා පොම්පාගාර පෞද්ගලික ඉඩම් වල පවතින බැවින් එම ඉඩම් හිමියන් සඳහා ප්‍රාදේශීය සභාව මගින් ජලය ලබා දීමේදී මුල් ඒකක 05 සඳහා ජල ගාස්තුව නිදහස් කර සහනයක් ලබා දීම <u>සුදුසු</u> යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ජී.ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

අපේ ජල ව්‍යාපෘතියේ ඇතැම් පොම්පාගාර , ටැංකි පෞද්ගලික ඉඩම් වල තියන නිසා ඒ අය යම් සහනයක් ඒ වෙනුවෙන් ඉල්ලුම් කරනවා. ඒ නිසා මුල් ඒකක පහ නොමිලයේ ලබා දීම සාධාරණයි. දැනට කුඩාගොඩ ඉඩම් දෙකක සහ බුකන්දයාගෙ ඉඩමක මේ ස්ථාපිත කිරීම් කරලා තියෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

අපි මේ සඳහා විරුද්ධත්වයක් නැහැ. මොකද ඒ අය වෙනුවෙන් යම් සහනයක් දෙන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ ඉඩම් අපි පවරා ගන්න ඕන. ඒ අයගේ අදහස් විටින් විට වෙනස් වෙනවා. ඒ නිසා ඒ සඳහා විධිමත්ව යමක් කළ යුතුයි.

**<u>ගරු ප්‍රා.ස.ම.ජේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා</u>**

මමත් ඒ කාරණය සමඟ එකඟ වෙනවා. මොකද කාලයක් යනකොට මේ අදහස් වෙනස් වෙනවා. යම් විදියකින් වැටවල් ගැහුවොත් අපිට නඩත්තු කටයුතු සඳහා යන්න බැරි වෙනවා. ඒ සඳහා අපිට උදාහරණ එනතරම් තියෙනවා. ඒ නිසා අපි විධිමත්ව ඒ කාර්යය කරමු.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඒ අනුව සභාව මගින් පාලනය වන ජල ව්‍යාපෘතියට අයත් කළ ලිං, ජල ටැංකි හා පොම්පාගාර පෞද්ගලික ඉඩම් වල පවතින බැවින් එම ඉඩම් හිමියන් සඳහා ප්‍රාදේශීය සභාව මගින් ජලය ලබා දීමේදී මුල් ඒකක 05 සඳහා ජල ගාස්තුව නිදහස් කර සහනයක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 7. ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා අය කිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා අය කිරීම මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.03. 16 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි සභාව මගින් පාලනය වන ජල ව්‍යාපෘතියෙහි පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා ජල මනු වෙනස් කිරීම් සහ ජල මනු වලට හානි කිරීම් හා උපාංග වලට හානි කිරීම සිදුවුව හොත් ඒ සඳහා ගාස්තු අය කිරීමක් සිදු කරන ලෙස සිදු කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා රු. 500.00 ක ස්ථාවර ගාස්තුවක් සහ නැවත පිළිසකර කිරීම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය සපයා දීම අදාළ පාරිභෝගිකයින් මගින් සිදු කිරීම හෝ තාක්ෂණ නිළධාරී ඇස්තමේන්තුව මත අමතර ගෙවීමක් සිදු කළ යුතු බවත් මේ සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයින් දැනුවත් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඊ.කේ.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මෙමගින් අදහස් කරන්නේ ඒ අයගේ අවශ්‍යතාවයන් මත වෙනස් කිරීමට ගිහින් ඇතිවන හානි කිරීම් වලට ගෙවීම් කරන්න කියලා.

ගරු ප්‍රා.ස.ම.ජේ.ජී. ගාමිණී මැතිතුමා

මේ සඳහා මූලික වශයෙන් රු. 500.00ක මුදලක් අය කරමු.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

එහෙනම් මේ කාර්යය සම්බන්ධව ජල මනු තියවන අය හරහා පාරිභෝගිකයින් දැනුවත් කරමු.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

මෙම සම්බන්ධයෙන් යම් යම් උපාංග ආදිය යොදවන්න වුණොත් ඒ සඳහා කවත් වියදමක් යන නිසා එම වියදම් ජල පාරිභෝගිකයින්ට දරන්න කියමු.

ඒ අනුව සභාව මගින් පාලනය වන ජල ව්‍යාපෘතියෙහි පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා ජල මනු වෙනස් කිරීම් සහ ජල මනු වලට හානි කිරීම් හා උපාංග වලට හානි කිරීම සිදුවුව හොත් ඒ සඳහා රු. 500.00 ක ස්ථාවර ගාස්තුවක් සහ නැවත පිළිසකර කිරීම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය සපයා දීම අදාළ පාරිභෝගිකයින් මගින් කිරීම හෝ තාක්ෂණ නිළධාරී ඇස්තමේන්තුව මත අමතර ගෙවීමක් සිදු කළ යුතු

බවත් මෙම සම්බන්දයෙන් අදාල පාරිභෝගිකයින් දැනුවත් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් පළවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 8. ආදාහනාගාර ගාස්තු සංශෝධනය කිරීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ආදාහනාගාරයේ ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම මැයෙන් අංක කප්‍රාය 21 හා 2022.03.18 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි වර්තමාන ආර්ථික තත්වය තුළ ගෑස් මිල ඉහළ යාමත් සමග ආදාහනාගාර ගාස්තු ඊට සාපේක්ෂව ඉහළ දැමීම සිදු කරන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව දැනට පවතින ආදාහනාගාර ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

බල ප්‍රදේශය තුළ ආදාහනයක් සඳහා ගාස්තුව - රු.10000.00

බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා ගාස්තුව - රු.12000.00

ගරු ප්‍ර.ස.ම.එම්.පී.ඩී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ දිනවල ගෑස් මිල ඉහල යාම ප්‍රශ්ණයක් අපිට ගෑස් වලට යන මිල වත් ආවරණය වෙන විදියට මේ ගාස්තුව වැඩි කරමු.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.බී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

දැනට බල ප්‍රදේශය තුළ රු.7000.00 ක් සහ බල ප්‍රදේශයෙන් පිටත රු.8500.00 ක් තමයි අය කරන්නේ.

**ගරු ප්‍රා.ස.ම.රමණී හල්පෙගමගේ මැතිතුමිය**

අපිට එක වරටම විශාල මුදලකින් වැඩි කරන්න අමාරුයි. ඒ සඳහා යම් කිසි සාධාරණ මුදලක් තීරණය කරන්න වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

එහෙම නම් අපි දැනට බල ප්‍රදේශය තුළ රු. 10000.00ක් හා බල ප්‍රදේශයෙන් පිටත රු.12000.00 ක් ලෙස අය කරමු. ඒත් අපිට ගෑස් සඳහා යන මුදල ආවරණය කරන්න අමාරුයි.

ඒ අනුව කටුවන ආදාහනාගාරයේ ආදාහනාගාර ගාස්තු පහත පරිදි එනම්

බල ප්‍රදේශය තුළ ආදාහනයක් සඳහා ගාස්තුව - රු.10000.00

බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා ගාස්තුව - රු.12000.00 ලෙස සංශෝධනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 9. කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන කුලියට ලබා දීමේ ගාස්තු සංශෝධනය කිරීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂය සඳහා සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීමට අදාලව අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම මැයෙන් අංක සපුස 19 හා 2022.03.18 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි වර්තමාන ආර්ථික තත්වය තුළ ඉන්ධන මිල ඉහළ යාමත් සමග කුලී පදනම මත ලබා දෙන යන්ත්‍රෝපකරණ සඳහා අය කරනු ලබන ගාස්තු ඉහළ දැමීම සිදු කරන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව දැනට පවතින යන්ත්‍රෝපකරණ සඳහා අයකරන ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

| වාහනය/යන්ත්‍රය | පැය/දින/ගමන් වාරයන් | ඉන්ධන සහිත/රහිත | දැනට අයකරනු ලබන ගාස්තුව | යෝජනා කරනු ලබන ගාස්තුව |
|---|---|---|---|---|
| 01. JCB යන්ත්‍රය | මීටර් පැය 01 | ඉන්ධන සහිත | රු.2500.00 | - |
| | | ඉන්ධන රහිත | - | රු.2500.00 |
| 02. බැකෝ ලෝඩරය | මීටර් පැය 01 | ඉන්ධන සහිත | රු.5000.00 | - |
| | | ඉන්ධන රහිත | - | රු.5000.00 |
| 03. රෝලර් යන්ත්‍රය | දිනකට (පැය 08) | ඉන්ධන රහිත | රු. 9000.00 | රු.12000.00 |
| 04. කොන්ක්‍රීට් කලවන යන්ත්‍රය (ක්‍රියාකරු සහිත) | දිනකට (පැය 08) | ඉන්ධන රහිත | රු. 9000.00 | - |
| 05. ලොරි ජල බවුසරය (4000L-තිල් ටැංකි) | එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | ඉන්ධන සහිත | රු. 2000.00 | රු. 2500.00 |
| 06. ලොරි පුද්ග පානීය ජල බවුසරය (6000L-පුද්ග ටැංකි) | එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | ඉන්ධන සහිත | රු. 2500.00 | රු.3000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 07. ලොරි ජල බවුසරය(13000L- සුදු පැහැති දිය ) | එක් ගමන් වාරයට (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | ඉන්ධන සහිත | රු.6000.00 | රු.6500.00 |
| 08. ට්‍රැක්ටර් ජල බවුසරය වාරිය (6000 L) | වාරිය (10 km) | ඉන්ධන සහිත | රු. 3500.00 | රු. 4500.00 |
| 09. ට්‍රැක්ටර් ජල බවුසරය(3000L) | එක් ගමන් වාරයට (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | ඉන්ධන සහිත | රු.1000.00 | රු. 1500.00 |
| 10. ට්‍රැක්ටර් ජල බවුසරය (4000L) | එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | ඉන්ධන සහිත | රු. 1200.00 | රු. 1750.00 |
| 11. ට්‍රැක්ටර් ජල බවුසරය (ට්‍රැක්ටරය සමඟ ජලය රහිතව) | දිනකට (පැය 08) | ඉන්ධන සහිත | රු.6000.00 | රු.10000.00 |
| 12. ට්‍රැක්ටරය | දිනකට (50km හෝ පැය 06) | ඉන්ධන සහිත | රු.5000.00 | රු.6000.00 |
| 13. ටිපර් රථය (කියුබ් 2.7) | දිනකට (100Km ක් තුළ ගමන් වාරයකට | ඉන්ධන සහිත | රු.12000.00 | රු. 13000.00 |
| | (බල ප්‍රදේශය තුළ 25km දක්වා) | | රු. 6000.00 | රු.7000.00 |
| 14. ටිපර් රථය (කියුබ් 1.5) | දිනකට ( 100 km තුළ) ගමන් වාරයකට | ඉන්ධන සහිත | රු.9000.00 | රු. 10000.00 |
| | (බල ප්‍රදේශය තුළ 25 km දක්වා) | | රු.4500.00 | රු.5500.00 |

සැ.යු.

01. රෝල යන්ත්‍රය /කොන්ක්‍රීට් කලවම් යන්ත්‍රය/ට්‍රැක්ටර් ජල බවුසරය (ට්‍රැක්ටරය සහිතව) හෝ වෙනත් යන්ත්‍ර දිනකට නියමිත පැය 08කට වඩා වැඩ කරන සෑම පැයකටම අමතර ගාස්තු අයවිය යුතුය.(ගාස්තුව 8* වැඩ කරන ලද අමතර පැයක ගණන)
02. ටිපර් රථය /ලොරි ජල බවුසරය අදාල සීමාවෙන් ඔබ්බට ධාවනය කරන්නේ නම් ඒ සඳහා වැඩිවන කිලෝ මීටරයකට රු.150.00ක ගාස්තුවක් අයවිය යුතුය.
03. ජල බවුසරය හා ටිපර් රථය ලබා ගැනීමේදී බල ප්‍රදේශයෙන් පිට කාර්යයන් හා අවශ්‍යතා සඳහා ලබා ගන්නා විටදී ඉහත සඳහන් ගාස්තු වලට අමතරව සම්පූර්ණ ගාස්තුවට 10% ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී.කෑලුම් කුමාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.බී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මෙම වාහන වල ගාස්තු පැයක් සඳහා කොහොද සකස් කරලා තියෙන්නේ.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මට, ඇතැම් වාහන වල දිනක ගාස්තුව දාලා තියෙනවා. ඒ බව මෙහි සටහන් වෙනවා.

ඒ අනුව වර්තමාන ආර්ථික තත්වය තුළ ඉන්ධන මිල ඉහළ යාමත් සමග කුලී පදනම මත ලබා ගන්නා යන්ත්‍රෝපකරණ සඳහා අයකරන ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව යෝජනා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා

### 06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.03.14 වන දින

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022.03.14 වන දින පැවති මුදල් කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද අංක 01 සිට 149 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම අනුමත බවත් අංක 01 සිට 05 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම අනුමත බවත් යෝජනා කරමි.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා විසින් පැමිණ සිටි කමිටු සාමාජිකයින් පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ආරම්භ කරන ලදී.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 14600.00 |
| 2. | එච්.ජී.චමින්ද විජේසිංහ මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4800.00 |
| 3. | එන්.එන්.වීරක්කොඩි මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 5280.00 |
| 4. | ජී.ඩී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4540.00 |
| 5. | එස්.කේ.ජී.ගුණරත්න මයා,ලිපිකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4110.00 |
| 6. | එම්.පසිඳු උදාර මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5248.00 |
| 7. | කේ.කේ.ජයරත්න මයා,ලිපිකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4282.00 |
| 8. | බී.ඒ.සමන් කුමාර මයා, ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5456.00 |
| 9. | ඩබ්.පී.ආර්.ධර්මරාජන මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 16406.00 |
| 10. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 12979.00 |
| 11. | ජී.කේ.සුරංග පුෂ්පකුමාර මයා,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2870.00 |
| 12. | ඩබ්.ජී.වසන්ත මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2745.00 |
| 13. | ප්‍රකාශ් ජනක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9447.00 |
| 14. | කේ.එච්.සේනාරත්න මයා,ලිපිකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9067.00 |
| 15. | චරණක ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 10975.00 |

| | | | |
|---|---|---|---|
| 16. | එම්.ඒ.ලලිත් නිශාන්ත මයා,බවුසර් සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1770.00 |
| 17. | කුමාර පලිහක්කාර මයා,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7862.00 |
| 18. | කේ.ජේ.රාමචන්ද්‍ර මයා, ජල වැද්දුම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 671.00 |
| 19. | ප්‍රියන්ත ජනනායක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 20. | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 3197.00 |
| 21. | බී.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5502.00 |
| 22. | සුජීව වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8383.00 |
| 23. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1540.00 |
| 24. | කේ.කේ.ආනන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1818.00 |
| 25. | ජේ.ඒස්.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 14732.00 |
| 26. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 13270.00 |
| 27. | ඊ.ඩී.බී.විමල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8583.00 |
| 28. | ජී.චිරංජිත් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2387.00 |
| 29. | කේ.ටී.එම්.රුවීර ප්‍රියංකර මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 13947.00 |
| 30. | ඒ.කේ.ඒ.ශ්‍රියාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 11337.00 |
| 31. | කවිඳු දිනේෂ්මික මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8250.00 |
| 32. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4478.00 |
| 33. | දිමුතු තුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7770.00 |
| 34. | එම්.ඒ.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2844.00 |
| 35. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4389.00 |
| 36. | ඒ.වසන්ත මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2360.00 |
| 37. | එස්. වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 10104.00 |
| 38. | කේ.කේ.නාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 39. | එම්.ගාමිණී මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8736.00 |
| 40. | යශ්මසිරි එන්ටර්ප්‍රයිස් පුද්ගලික සමාගම, රත්න සාර, අඟුණුකොළපැලැස්ස | ආපනාගාරය සඳහා 2022.01.10 දින 37.5kg ගෑස් පිරවූ ගෑස් සිලින්ඩර් 06 ක් මිලදී ගැනීම | 50778.00 |
| 41. | දිමුතු තුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල | 13837.00 |

| | | | |
|---|---|---|---|
| 42. | එන්.එච්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2021 දෙසැම්බර් මස අතිකාල | 2841.00 |
| 43. | අජිත්ති අබේනායක මිය,කැඳෙන් ගෙදර වු,කටුවන පාර,මිද්දෙනිය | 2022.01.20 දින පැවති මහා සභාවට සහභාගී වූ මහජන නියෝජිතයින්ට හා නිලධාරීන්ට සංග්‍රහ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම<br>• ෆ්‍රයිඩ් රයිස් 40 -රු17200.00<br>• කට්ලට් 100-රු 6000.00<br>• කොකෝල් කේක් 40-රු1600.00<br>• ක්‍රීම් ක්‍රැකර් 01-රු 260.00<br>• බිස් 40-රු1920.00<br>• සර්වියට් පේපර් පැකට්02-රු 220.00<br>• වතුර බෝතල් 40-රු 1400.00 | 28600.00 |
| 44. | ඩබ්.ජී.අනිතා කුමාරි මිය,අසෝමසිරි ස්ටෝර්ස්,නුගේම පාර,මිද්දෙනිය | 2022 ජනවාරි මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7520.00 |
| 45. | එම්.ජී.අමරසේකර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ජල මනු කියවන්නාගේ මාසික දිරි දීමනාව යටතේ 2021 දෙසැම්බර් මස සඳහා වන ජල බිල් බෙදා අවසන් කර ඇති බැවින් ඉන්ධන දීමනාව ගෙවීම | 1000.00 |
| 46. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 9800.00 |
| 47. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | ආනාමඩුවේ ව්‍යාපෘතියේ තත්ව සහතිකය ලබා ගැනීම සඳහා දැඹුල්ල පොල් පර්යේෂණ ආයතනයට ගෙවීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 6350.00 |
| 48. | ඩබ්.ජී.වසන්ත කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | ජල මනු කියවන්නාගේ මාසික දිරි දීමනාව යටතේ 2021 දෙසැම්බර් මස සඳහා වන ජල බිල් බෙදා අවසන් කර ඇති බැවින් ඉන්ධන දීමනාව ගෙවීම | 1000.00 |
| 49. | එම්.චමිලා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 3320.00 |
| 50. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 5500.00 |
| 51. | කේ.පී.ටී.හර්ෂණි මිය,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 5500.00 |
| 52. | කේ.එච්.එන්.ටී.ඉනෝදිකා මිය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 2100.00 |
| 53. | කේ.සී.සංජීව මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 2000.00 |
| 54. | සමිදු දිනෝෂිත මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි ගමන් වියදම් | 3150.00 |
| 55. | ඩබ්.ප්‍රසාදිනී මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 6200.00 |
| 56. | ඩබ්.ආර්.කුමාර මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස සංචාරක ගමන් වියදම් | 5500.00 |
| 57. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 14955.00 |

| | | | |
|---|---|---|---|
| 58. | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර,කටුවන | 2022 ජනවාරි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 8260.00 |
| 59. | එල්.ජී.සම්පත් මයා,සැම්ද් මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ පෙර පාසල්වලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් | 299970.00 |
| 60. | දම්මික ට්‍රේඩ් සෙන්ටර් පුද්ගලික සමාගම,වලස්මුල්ල පාර,මිද්දෙනිය | මිද්දෙනිය උපකාර්යාලයට සංශෝධන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 40059.69 |
| 61. | ආර්.පී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9728.75 |
| 62. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9728.75 |
| 63. | ජේ.ඒ.රංජිත් කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9728.75 |
| 64. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9728.75 |
| 65. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4377.50 |
| 66. | එම්.ජී.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4377.50 |
| 67. | කේ.පී.සංජීව මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පොළ පරීක්ෂණ දීමනාව | 4000.00 |
| 68. | ටී.පියරත්නා නන්මාලි මිය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 3384.00 |
| 69. | පමෝදා අරුණප්‍රභා සංසා මෙය,කළමනාකරණ සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 3384.00 |
| 70. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 9440.00 |
| 71. | එස්.පී.අමිල සම්පත් මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල | 808.00 |
| 72. | කේ.වී.පතිනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල | 2023.00 |
| 73. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ මහ සභාවට සහභාගී වන මහජන නියෝජිතයින්ට හා නිලධාරීන්ට සංග්‍රහ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 20000.00 |
| 74. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කිරම බස්නැවතුම්පොළ විවෘත කිරීමට අදාළව පූර්ව සූදානම් කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 50000.00 |
| 75. | ජේ.ඩිලාන් මයා,චන්ද්‍රා ස්ටෝර්ස්, මිද්දෙනිය පාර,කටුවන | 2021 නොවැම්බර් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7100.00 |
| 76. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 14665.00 |
| 77. | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස ගමන් වියදම් | 630.00 |
| 78. | ජයමිණි ට්‍රාන්ස්පෝර්ට්, අඹන්තා, හාමරංගස්හේන,කිරම | කටුවන ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ඩෙංගු මර්දන වැඩසටහනට කුලී පදනම මත JCB යන්ත්‍රයක සේවාව ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 137200.00 |
| 79. | එස්.ටී.මෝටෝ ගරාජ් සෙන්ටර්, ප්‍රංගම පාර,මිද්දෙනිය | ZA-2978 JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අදාළ ආයතනය වෙත ගෙවිය යුතු මුදල් ලබා දීම | |

| | | | |
|---|---|---|---|
| | | | 31650.00 |
| 80. | එස්.ටී.මහවත් ආර්සයාවින් සෙන්ටර්, හුංගම පාර,මිද්දෙනිය | LL-7399 ජල බවුසරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අදාල ආයතනය වෙත ගෙවිය යුතු මුදල් ලබා දීම | 9500.00 |
| 81. | එන්.එස්.එච්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 252-6508 කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ගෙවීම | 16155.00 |
| 82. | ඉමේෂා කම්පියුටර් ටෙක්නොලජී,අංක 02,කාලිදාස මාවත,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පරිගණක ඇතුළු අනෙකුත් උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• පරිගණක 04-රු 628000.00<br>• මවුස් 04- රු2400.00<br>• කීබෝඩ් 04- රු3400.00<br>• තර්මල් ප්‍රින්ටර්ස් 04-රු107000.00<br>• Virus guard 07-රු 12950.00<br>• UPS 04-රු24800.00 | 778550.00 |
| 83. | ඉමේෂා කම්පියුටර් ටෙක්නොලජී,අංක 02,කාලිදාස මාවත,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටෝනර් ඇතුළු කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• Epson LQ 310 රිබන් 05-රු6000.00<br>• Epson LQ 2090 රිබන් 10-රු 42000.00<br>• Samsung 2850 ටෝනර් 01-රු 18500.00<br>• Hp 85 A Original Toner 08-රු67200.00<br>• Toshiba T-2309p Original Toner 07-රු117600.00<br>• Epson 664 Original black ink 20-රු34000.00<br>• Epson 664 Original cyan ink 10-රු17000.00<br>• Epson 664 Original magenta ink 10-රු17000.00<br>• Epson 664 Original yellow ink 10-රු17000.00<br>• HP 78 A Toner 03-රු44250.00 | 380550.00 |
| 84. | එල්.ජී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | 2022 වර්ෂයේ I වන කාර්තුව සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 2540.00 |
| 85. | සාමාන්‍යාධිකාරී, බී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම සඳහා 2022.02.01 සිට 2022.02.14 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• 53-1634- ඩීසල්-170L<br>• ZA -2978-ඩීසල්-260 L | |

| | | | |
|---|---|---|---|
| | | • ZA-2978-සොල්වෙන්ට්-100 ml<br>• ගබඩාව-පෙට්‍රල්-40L<br>• ගබඩාව-භූමිතෙල්-10L<br>• RB-3498- ඩීසල්-64 L<br>• LL-7399-ඩීසල්-85L<br>• RE-9230-එන්ජින් ඔයිල්-6L<br>• RE-9230-ඩීසල්-30L<br>• PF-7414-ඩීසල්-65L<br>• 227-5870- ඩීසල්-84L<br>• 75-3743-ඩීසල්-7 L<br>• 270-0429- ඩීසල්-80 L<br>• MOH- ඩීසල්-80 L<br>• MOH- පෙට්‍රල්-16 L<br>• LK-9589-ඩීසල්-80L<br>• 252-6508-ඩීසල්-105 L<br>• BAK-9907-පෙට්‍රල්-20L<br>• RC-7796-ඩීසල්-35L<br>• RC-5539-ඩීසල්-40L<br>• LL-6446-ඩීසල්-90L<br>• RE-8995-ඩීසල්-40L | 177617.00 |
| 86. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 පෙබරවාරි මස මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7160.00 |
| 87. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2021 ජනවාරි මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7490.00 |
| 88. | මනම්පේරි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් (අගල් 3 ඇණ5/8 ×3") | 12750.00 |
| 89. | එම්.වජිසිතා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 90. | රත්නායක ටයර් හවුස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | LL-6446 අංක දරන ටිපර් රථයේ ටයර්,ටියුබ් හා ටේප් සැපයීම වෙනුවෙන්(ටිපර් රථයේ වම්පස පිටුපස රෝදයේ ටයර් දෙක) | 107400.00 |
| 91. | මනම්පේරි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ පොළවල් සඳහා නාමපුවරු සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 13850.00 |
| 92. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූර්ණය කිරීම | 9730.00 |
| 93. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.02.02 දින පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනාව ගෙවීම | 4500.00 |
| 94. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.02.25 දින පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනාව ගෙවීම | 6000.00 |
| 95. | වී.කේ.මාලා පද්මලතා මිය,සැලසුම් නිලධාරී,නාගරික සංවර්ධන අධිකාරිය | 2022 ජනවාරි මස ගමන් වියදම් | 1242.00 |
| 96. | එම්.කේ.වී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පරිවර්තීය ගමන් වියදම | 1500.00 |
| 97. | විධායක ලේකම්,තොරතුරු සේවා මධ්‍යස්ථානය | කොම්පියුටර් ව්‍යාපෘතියට අවශ්‍ය ERP සොෆ්ට්වෙයාර් මිලදී ගැනීම | 25500.00 |

| | | | |
|---|---|---|---|
| 98. | ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 505.00 |
| 99. | රෝහිත දිල්ෂාන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 888.00 |
| 100 | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 888.00 |
| 101 | අමිර හේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 888.00 |
| 102 | ගයාන් සමින්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 888.00 |
| 103 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ රාජකාරී කටයුතුවල නිරත නිලධාරීන් සඳහා ජේ පැන් සංග්‍රහයක් ලබා දීමට අවශ්‍ය අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 5000.00 |
| 104 | එම්.ඒ.ප්‍රේමලතා මිය, සමගි බුෆේ, කටුවන පාර, මිද්දෙණිය | 2022 පෙබරවාරි මස මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීමට (චිකන් ඩ්‍රම්ස්ටික් ෆ්‍රයිඩ් රයිස් 45 ක්) අදාළව ගෙවීම් කිරීම | 20250.00 |
| 105 | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ 2022.02.17 පැවති මහා සභාවට සහභාගී වූ මහජන නියෝජිතයින් ඇතුළු පිරිසට සංග්‍රහ කිරීමට ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම<br>• ලන්ච් බොක්ස් 45-රු 1125.00<br>• වටලප්පන් ප්ලාස්ටික් කප් 45-රු315.00<br>• පුවාලු කෙසෙල් 3kg -රු585.00<br>• චීස් 120g රෝල් 05-රු1800.00<br>• පේපර් සර්වියට් මිට 100-රු95.00<br>• ක්‍රීම් ක්‍රැකර් 500g පැකට් 01-රු 250.00<br>• ගස් කජු 1kg -රු 4500.00<br>• රෝල්ස් 100-රු 4500.00<br>• ඔමලට් බන් 40-රු 1400.00<br>• චීස් පැක්(කෑලිකාව)01-රු330.00<br>• ක්‍රීම් ක්‍රැකර් 500g පැකට් 01-රු 130.00<br>• නිස්ලෙයි වතුර බෝතල් 08-රු280.00<br>• කිස්ට තකල්ස් වතුර බෝතල් 32-රු1120.00 | 16430.00 |
| 106 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 21729.09 |
| 107 | ඩී.ජී.මාලා පද්මලතා මිය, සැලසුම් නිලධාරී, නාගරික සංවර්ධන අධිකාරිය | 2021 දෙසැම්බර් මස ගමන් වියදම් | 1152.00 |
| 108 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | මිද්දෙණිය බිබුල ප්‍රධාන ජල [illegible] හදිසි විදුලි අක්‍රිය වීම හේතුවෙන් නඩත්තු කටයුතු සඳහා | |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය උපාංග ලබා ගැනීම සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 12000.00 |
| 109 | සෝභසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම, රත්නා පාර, අලුත්කොළපැලැස්ස | ආපදාගාරය සඳහා 2021.02.28 දින 37.5kg ගෑස් පිරවූ ගෑස් සිලින්ඩර් 06 ක් මිලදී ගැනීම | 52278.00 |
| 110 | ලියනගේ කන්ස්ට්‍රක්ෂන්, E03, සිංහගම, අලුත්කොළපැලැස්ස | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2021 දැලකිරියාව අඹුදම්තා ඇළ මාර්ගයේ පාලම ඉදි කිරීමට අදාළ පළමු ගෙවීම | 3000000.00 |
| 111 | ලියනගේ කන්ස්ට්‍රක්ෂන්, E03, සිංහගම, අලුත්කොළපැලැස්ස | අඹුදම්තා ඇළට පාලමක් ඉදි කිරීම ව්‍යාපෘතියේ ටෙන්ඩර් ඇප තැන්පතු මුදල නිදහස් කිරීම | 25000.00 |
| 112 | සුබිදු ගොවි සංවිධානය, රුක්මල්පිටිය, කටුවන | ගල්පොකුණාදෙ පෙර පාසලේ වැසිකිළිය තැනීම<br>• 10% රඳවුම්-රු58658.84 | 527929.56 |
| 113 | Access Engineering PLC, 278, යුනියන් පෙදෙස, කොළඹ 02 | කිරම මිත්තැන්නකුඹුරුපොල ප්‍රවේශවන කොටසේ ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් (කාපට්) ටොන් 16 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 191808.00 |
| 114 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.02.10 දින මිද්දෙනිය බිඳුල ජල බලාගාරයේ හදිසි කඩිත්තු කටයුත්තක් වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 11970.00 |
| 115 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.02.18 දින සහ 2022.02.25 පැවති පාරිසරික ප්‍රගති සමාලෝචන කමිටුව සඳහා කෑම දීමනාව ගෙවීම | 7000.00 |
| 116 | සෙනෙහාස් ට්‍රේඩ් කම්පැනි (පුද්)සමාගම, තල් අරඹ, කඹුරුගමුව, මාතර | කටුවන ප්‍රාදේශීය සභාව සතු ZA-2978 අංක දරන බැකෝ යන්ත්‍රයට අවශ්‍ය මිලදී ගැනීම වෙනුවෙන් | 33016.00 |
| 117 | එල්.ජී.සම්පත් මයා, සඳු මල්ටි කලෙක්ෂන් ,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නිල කාමරයේ ඇතිරීම සඳහා අවශ්‍ය රබර් කාපට් මිලදී ගැනීමට අදාළව ගෙවීම කිරීම | 33250.00 |
| 118 | එම්.දිනුෂ්ත් රෙහුල මයා;ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 119 | එම්.එම්සිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4650.00 |
| 120 | ඩබ්.ප්‍රභාෂණී මිය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4800.00 |
| 121 | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 3150.00 |
| 122 | කේ.පී.සංජීව මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 2000.00 |
| 123 | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 5120.00 |
| 124 | එච්.ඒ.චමින්ද විකුමසිංහ මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 1764.00 |
| 125 | ජී.වී.පී.යමුනා තිල්මිණී මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4800.00 |
| 126 | කේ.ජී.ටී.හර්ෂණී මිය,තාක්ෂණ සේවා නිලධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 4900.00 |
| 127 | ඩබ්.ආර්.කුමාර මයා, තාක්ෂණ සේවා නිලධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් | 5500.00 |

| | | | |
|---|---|---|---|
| 128 | එස්.එස්.වීරක්කොඩි මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පරිවර්තන ගාස්තු වියදම් | 2920.00 |
| 129 | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9685.25 |
| 130 | කිරිති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9685.25 |
| 131 | ජේ.ඒ.රංජිත් කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9685.25 |
| 132 | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 9685.25 |
| 133 | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3841.00 |
| 134 | එම්.ජී.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3841.00 |
| 135 | කේ.පී.සංජීව මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පොළ පරීක්ෂණ දීමනා ගෙවීම | 4000.00 |
| 136 | එස්.එම්.හෙවි හයිඩ්‍රොලික්, දුනුමඩල, ගල්පොත්තයාය, ජුලම්පිටිය | ZA-2978 බැකෝ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 58100.00 |
| 137 | එස්.එම්.හෙවි හයිඩ්‍රොලික්, දුනුමඩල, ගල්පොත්තයාය, ජුලම්පිටිය | SNH-2011153රෝල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 20000.00 |
| 138 | එස්.එම්.හෙවි හයිඩ්‍රොලික්, දුනුමඩල, ගල්පොත්තයාය, ජුලම්පිටිය | SNH-2011153 රෝලරයේ පසුපස සිල් කිට් හා සීල් සෙට් යෙදීමට අදාළව ගෙවීම | 90000.00 |
| 139 | පෝස්ට් මාස්ටර් ජනරාල්,තැපැල් කාර්යාලය,මිද්දෙනිය | 2022.03.11 දින සිට ඉදිරියට ලිපි තැපැල් කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම | 30000.00 |
| 140 | වීරසිංහ හාඩ්වෙයාර්,අංක 79 ඒ,මහ වීදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවේ ජල අංශය සඳහා අවශ්‍ය ජල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 1691293.00 |
| 141 | එම්.කේ.සචින් චතුරංග මයා,3 කණුව,පෙරහැවිය පාර,ඇඹිලිපිටිය | සභාවට අවශ්‍ය 2'×8'' හා 3'×8' හියුම් පයිප්ප මිලදී ගැනීමට අදාලව ගෙවීම | 1783460.00 |
| 142 | ඩී.බී.නිශාන්ත මයා,හිරුප්,නාවනලිය,කිරම | කිරම බස්නැවතුම්පොළ ඉදිරිපිට මාර ගස් දෙකක් කපා ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම | 175000.00 |
| 143 | පී.ජී.ජී.ධනංජන මයා,ධනංජන සයිකල් මාට්,පසාමුර පාර,මිද්දෙනිය | SNH-2011153 රෝලර් යන්ත්‍රයේ අළුත්වැඩියා කිරීමේදී අවශ්‍ය වූ හයිඩ්‍රොලික් හා ලීස් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 8500.00 |
| 144 | සාමාන්‍යාධිකාරී, බී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා භාවිතා කිරීම සඳහා 2022.02.15 සිට 2022.02.18 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• 227-5870- ඩීසල්-90L<br>• RC-7796-ඩීසල්-70L<br>• ZA -2978-ඩීසල්-250 L<br>• RB-3498- ඩීසල්-72 L<br>• 227-5163- ඩීසල්-50 L<br>• RC-5539-ඩීසල්-40L<br>• MG- ඩීසල්-340 L<br>• PC-7414-ඩීසල්-182L<br>• 252-6508- ඩීසල්-204L | |

| | | | |
|---|---|---|---|
| | | • ගබඩාව-එන්ජින් ඔයිල්-4L<br>• ගබඩාව-පෙට්‍රල්-20L<br>• ගබඩාව-ඩීසල්-580L<br>• 53-1634- ඩීසල්-60L<br>• LK-9589-ඩීසල්-60L<br>• RE-8995-ඩීසල්-42L<br>• BAK-9907-පෙට්‍රල්-10L<br>• LL-6446-ඩීසල්-75L<br>• MOH- ඩීසල්-40 L<br>• MOH- පෙට්‍රල්-08 L<br>• PA-8630- ඩීසල්-60L<br>• RE-8995-ඩීසල්-35L | 281776.00 |
| 145 | නාන්දන කරුණාතිලක මයා.වියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස අතිකාල | 9136.00 |
| 146 | නාන්දන කරුණාතිලක මයා.වියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස ගමන් වියදම් | 13650.00 |
| 147 | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස ගමන් වියදම් | 12000.00 |
| 148 | එම්.දිනුෂික් රත්නදුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 9100.00 |
| 149 | එල්.බී.බී.දුල්කානි මිය,ලක්ෂාන් ඇඩ්වටයිසින්,විරකැටිය පාර.මිද්දෙනිය | දෙහිගහගෙත්ත ආයුර්වේද මධ්‍යස්ථානයේ නාම පුවරුව සම්පූර්ණයෙන් සැකසීම | 30150.00 |

ඉහත වවුචර් අංක 01 සිට 149 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවෙන් නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1. කටුවන ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘතියේ දැනට අක්‍රියව පවතින හා දෝෂ පවතින ජල මෝටර් හා පොම්ප පිළිබඳව තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවක් ලබාගෙන අක්‍රිය ජල මෝටර් වෙනුවට නව ජල මෝටර් මිලදී ගැනීමටද අලුත්වැඩියා කළ යුතු ජල මෝටර් කඩිනමින් අලුත්වැඩියා කිරීම ද සිදු කළ යුතු බවට යෝජනා විය.
2. කඩා ඉවත් කරනු ලබන කිරම පැරණි කඩ කාමරවල තාක්ෂණ නිලධාරී නිර්දේශ අනුව භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින ලී දඬු හා උළුකැට සභාව වෙත යොමු ඉල්ලා ඇති අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත ලබා දීමට සුදුසු බවට යෝජනා විය.
3. කිරම බස්නැවතුම්පොළ කඩ කාමර ලබා දීමේදී ලී බඩු සාප්පුවක් හා සුළු අපනයන බෝග භාණ්ඩ වෙළඳසැල යන කඩකාමරවල භාණ්ඩ ප්‍රවාහනයේදී පවතින අපහසුතා හේතුවෙන් එම පාර්ශව අදහස සලකා සහ ඉල්ලුම්කරන ලද අනෙක් පාර්ශවය සඳහා ද එම ස්ථානයේ අළුතින් ඉදිකරන ලද කඩ කාමර ලබා දීමට යෝජනා විය.තවද පුවත්පත් අලෙවිය සඳහා ලබා දුන් කඩ කාමරය ඒ අය සඳහා ප්‍රමාණවත් නොවන නමි ඒ සඳහාද එම පාර්ශවයෙන් එක්වරක් මුදල් ලබා ගෙන නව කඩ කාමරයක් ඉදිකර දීමට යෝජනා විය.

4. මෝටර්ග්‍රේඩරයේ ටෙබ්ඩ ගෙවී ඇති බැවින් ඒ සඳහා අමතර කොටස් හා ග්‍රීස්,හයිඩ්‍රොලික් ඔයිල් ඉන්ධන පිරවුම්හලේ නොමැති බැවින් ඒ සඳහා පහත සඳහන් අමතර කොටස් ලබා දෙන මෙන් ජී.සමීර මධුශංක මයා ඉල්ලීම්කර ඇත.

- අඩි 06 ටෙබ්ඩ කැබලි 04
- සයිඩ් කටර් කැබලි 02
- ටෙබ්ඩ සවි කිරීමට ඇණ
- ග්‍රීස් 15 kg
- හයිඩ්‍රොලික් ඔයිල් 20L

ඉහත සඳහන් ද්‍රව්‍ය ලබා දීමට සුදුසු බව යෝජනා විය.

5. කිරම බස්නැවතුම්පල ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේදී ලබා ගන්නා ලද හා දිය කාර බැරලය සඳහා එම ආයතනයට ගෙවිය යුතු මුදල දැනට එම ආයතනයේ කටයුතු සඳහා කුලී පදනම මත යොදවා ඇති පසාට සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට අය විය යුතු මුදලින් අඩු කිරීමටත් ඒ අනුව අවශ්‍ය පරිදි ගැලපීමට කටයුතු කිරීමටත් සුදුසු බව තීරණය විය.

ගරු ප්‍රා.ස.ම. ජී.සී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙම මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ 142 වන අංකය යටතේ ඩී.බී.නියාන්ත මයා, හිරයේ, කටහැලිය, කිරම යන ලිපිනයෙහි පදිංචි අය හට කිරම පොළ භූමියේ පිහිටි මාර ගස් දෙක කපා ඉවත් කිරීම වෙනුවෙන් රු. 175000.00 ක මුදලක් ගෙවා ඇති බව සඳහන් වෙනවා. මෙම ගෙවීම් සම්බන්ධව අපිට එකඟ වෙන්න බෑ. ගස් දෙක කැපීම සඳහා ගෙවීම සම්බන්ධව අපගේ විරෝධය ප්‍රකාශ කරනවා. මෙම ජනතාවගේ මුදල් අත්තනෝමතික ලෙස පරිහරණය කිරීම සම්බන්ධව අපි විරුද්ධයි. ඒ නිසා මෙම මුදල් කමිටු වාර්තාව සඳහා අපගේ අනුමැතිය ලැබෙන්නේ නැහැ.

ඒ අනුව මුදල් කමිටු වාර්තාව සඳහා ජාතික විමුක්ති පෙරමුණ නියෝජනය කරන ලද

01.ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා

02.ගරු ප්‍රා.ස.ම. එච්. එස්. ඒ. ආනන්ද කුල සුන්දර මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ම. ප්‍රදීපා නිශංසලා මැතිතුමිය යන අයගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන ලද අතර

මුදල් කමිටු වාර්තාවේ අංක 01 සිට 149 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සිට 05 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් බහුතර එකඟතාවය මත සභා සම්මත විය.

## <u>06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 පෙබරවාරි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ පෙබරවාරි මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ඇලි මගින් රු.488980.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ඩාහැකි දීමනා වෙනුවෙන් රු. 56423.00

ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.432557.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඊ.පී.නියාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 පෙබරවාරි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 පෙබරවාරි මස</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 පෙබරවාරි මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:815750.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,වියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 473091.60 ක වියදමක් දරා ඇත. එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 342658.40ක ලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 පෙබරවාරි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 පෙබරවාරි</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා පෙබරවාරි මස රු.459393.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 පෙබරවාරි මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති. බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ ඒකඟතාවය මත සභා සම්මත කරන ලදි.

**<u>06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 ජනවාරි මස</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

2022 ජනවාරි මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 3196953.40ක් වන අතර මාසික වියදම රු.277498.20ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 2919455.20 කි. ඒ අනුව අප්‍රේල් මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.සී.සැලුම් කුමාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 ජනවාරි මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2022 ජනවාරි මස</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාලව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 ජනවාරි මස වන විට ආරම්භක හිඟය රු: 9749817.97 ක් වන අතර ජනවාරි මස අවසාන හිඟය රු: 9145681.61ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 604136.00කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සුගත් සරම්ගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 ජනවාරි මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 07 වාර්තා

**ගරු සභාපති අයි.ඒ. මහින්ද මැතිතුමා**

සභාව මඟින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස.07 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
    1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
    2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
    3. 0072633606- කර්මාන්ත ගිණුම
    4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
    5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
    6. 265-1-001-2-7876595- කපාල ව්‍යාපෘති ගිණුම
- 2022 මාර්තු මස ප්‍රා.ස. 14 ,16 වාර්තා

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 පෙබරවාරි මස ගෙවීම හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රාස 14,16 වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම

**ගරු සභාපති අයි. ඒ. මහින්ද මැතිතුමා.**

කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම මැනවින් අංක කප්‍රාස /18/වාහන හා 2022.03.21 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි වර්තමාන ආර්ථික අර්බුදය හා ආනයන සීමා වීමේ තත්වය මත ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා නව ටයර් මිලදී ගැනීමේදී ටයර් හිඟයකට මුහුණ දීමට සිදු වන බැවින් ඒ සඳහා භාවිතා කරන ලද ටයර් නැවත පිරවීමට හෝ නැවත පුරවන ලද ටයර් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ .සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

ඒක හොඳ අදහසක්. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා.**

ඒත් සමහරවිට එම ටයර් නැවත පිරවීමේ ස්ථානයක් සභාව මඟින් ස්ථාපිත කර නඩත්තු කිරීමට ඇත්නම් එමඟින් හොඳ සේවාවක් සපයන්න පුළුවන්. ඒත් එක්කම හොඳ ආදායමක් උපයන්න පුළුවන්. ඒ නිසා ඒ සඳහා ව්‍යාපෘතියක් සකස් කරන්න කියලා මම යෝජනා කරනවා. ඒත් එක්කම අපිට අවශ්‍ය විටදී කුලියට දෙන්න සහ සභාවේ ප්‍රයෝජනය සඳහා තෙප්පැලගේ මැෂින් දෙකක් මිල කැඳවීම් කරලා මිලදී ගන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ඒ කටයුත්ත කරමු.

ඒ අනුව ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා අවශ්‍ය ටයර් මිලදී ගැනීමේදී භාවිතා කරන ලද ටයර් නැවත පිරවීමට හෝ නැවත පුරවන ලද ටයර් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-2. සභාව සතු රෝලර් යන්ත්‍රය පටවා ගෙන යාම සඳහා ලෝබෙඩ් රථයක් සකසා ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු රෝලර් යන්ත්‍රය පටවා ගෙන යාම සඳහා ලෝබෙඩ් රථයක් සකසා ගැනීම මැයෙන් ඇඹ.කඩ.ප්‍රාස /18/වාහන හා 2022.03.21 දිනැති ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති පරිදි සභාව සතු රෝලර් යන්ත්‍රය ප්‍රවාහනය සඳහා ලෝබෙඩ් රථයක් සකස් කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව බිබුල ජල බලාගාර පරිශ්‍රය තුළ පවතින භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රැක්ටර් ටේලර් වැසියක් යොදා ගෙන ප්‍රාදේශීය කාර්මික ආයතනයක් මඟින් සභා අරමුදල් යොදවා එය සකස් කර ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ සඳහා දැනට භාවිතා කරන්නේ අපේ ටිපර් රථය. අපි ඒ සඳහා සුදුසු ලෝබෙඩ් රථයක් සකසා ගනිමු.

ඒ අනුව සභාව සතු රෝලර් යන්ත්‍රය ප්‍රවාහනය සඳහා ලෝබෙඩ් රථයක් සකස් කර ගැනීම සඳහා බිබුල ජල බලාගාර පරිශ්‍රය තුළ පවතින භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රැක්ටර් ටේලර් වැසියක් යොදා ගෙන ප්‍රාදේශීය කාර්මික ආයතනයක් මඟින් සභා අරමුදල් යොදවා එය සකස් කර ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-3 දෙහිගහහේන්න ආයුර්වේද සායනයේ කටයුතු ක්‍රමවත් කර ගැනීම සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

දෙහිගහහේන්න ආයුර්වේද සායනයේ කටයුතු ක්‍රමවත් කර ගැනීම මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමන් විසින් 2022.03.21 දිනැති ලිපියෙන් ඉල්ලුම් කර ඇති පරිදි එහි පහත අලුත් වැඩියාවන් තාක්ෂණ නිලධාරී මහතා මඟින් වාර්තාවක් සකස් කර සභා අරමුදලින් සංවර්ධනය කර දීම සුදුසු බවත් එම සායනය සඳහා අවශ්‍ය පහත උපකරණ අදාල සැපයුම් ආයතන මඟින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01. මෙම සායන කටයුතු පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ වහලයෙන් රෝගීන් පරීක්ෂා කරන කාමරය සහ ඖෂධ ලබා දීමට භාවිතා කරන පරිශ්‍රය වර්ෂාවෙන් තෙමෙන බැවින් එම ගොඩනැගිල්ලේ වහලය අලුත් වැඩියා කිරීම

02. රෝගීන් සහ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවයන් සඳහා ජල සැපයුම් ක්‍රමයක් කර අත් සේදීමට සහ බඳුන් සෝදා ගැනීමට එම ස්ථානයේ සින්ක් එකක් සවි කිරීම.

03. දැනට එම ගොඩනැගිල්ලේ ඇති වැසිකිළිය ඉතාමත් අබලන් වී ඇති බැවින් එය භාවිතයට ගත හැකි පරිදි අලුත් වැඩියා කිරීම.

04. එම ගොඩනැගිල්ල සඳහා ඇති ප්‍රවේශ මාර්ගය රෝගියෙකුට වාහනයකින් එම නිවෙස් මිදුලට පැමිණිය හැකි පරිදි සංවර්ධනය කිරීම.

අත්‍යවශ්‍ය උපකරණ සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය

01.ඖෂධ සුරක්ෂිතව තබා ඒම සඳහා අගුළු දැමිය හැකි වාගේ අල්මාරියක්

02.දැනට ඇති වාගේ අල්මාරිය සඳහා යතුරු කට්ටලයක්

03. ස්ටැන්ඩ් ෆෑන් -2

04.ප්‍රෙෂර් මීටර් - 1

05.ස්ටෙතස් කෝප් - 1

06.මෙෂරින් ග්ලාස් ( මිලි ලීටර් 200-1, මිලි.ලීටර් 50 – 02)

07.ඖෂධ වර්ග බහා තබන (කිලෝ 1ක පමණ) භාජන - 36

08.බෝතල් ප්‍රවාහනයේදී අසුරා තැබීමට බෝතල් කේස් 12ක්

09.රබර් පාපිසි -03

10.Face sheald – 6

11.පේපර් සර්විසට් පැකට් - 1

12.මිටි සහිත මොප් -1 මොප් බාල්කට් - 1

13.මිටි සහිත කොසු - 01

14.ඩස්ටර් -6

15.වයර් කෝඩ් -01

යෝජනා කරමි.

ගරු ආ.ස.ම. මංගලා දිසානායක මැතිනිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති-අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

අපි පැදිගහගේන ආයුර්වේද මධ්‍යස්ථානය කාලයක් තිස්සේ බලාපොරොත්තුවෙන් ඉඳලා ලබපු ආරම්භ කලේ. ඒ නිසා එහි අඩු පාඩු ටික තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තුවක් හදලා සකස් කරලා දෙමු. අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිල කැඳවීම් කරලා මිලදී ගනිමු.

ඒ අනුව දෙහිගහමෙහෙ ආයුර්වේද මධ්‍යස්ථානයේ අලුත් වැඩියාවන් සම්බන්ධව තාක්ෂණ නිළධාරී මහතෙකු මඟින් වාර්තාවක් සකස් කර සභා අරමුදලින් සංවර්ධනය කර දීම සම්බන්ධවත් එම ස්ථානය සඳහා අවශ්‍යය උපකරණ අදාළ සැපයුම් ආයතන මඟින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 4 .නව ජල මෝටර් දෙකක් ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

නව ජල මෝටර් දෙකක් ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.03.21 දිනැති ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති පරිදි බිබුල ජල බලාගාරය සඳහා සවි කර ඇති මෝටර් අක්‍රිය වීම හේතුවෙන් ඒ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් මත නව මෝටර් දෙකක් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා.</u>

අපි වර්ෂාව නොමැති කාලයට ලොකු වතුර ප්‍රශ්ණයකට මුහුණ දෙනවා . නමුත් මෑතකදී අපිට ඒ ගැටළුව ආවේ නැත්තේ අපි මෝටර් අලුත් කරලා තිබුණ නිසා. අපි ඉක්මණින් ඒ අවශ්‍ය මිලදී ගැනීම කරමු.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපිට උතුර ළිඳ සහ කුඩාගොඩ ළිඳ මේ සඳහා ගොඩක් ප්‍රයෝජනවත් වුණා. මේ බිබුල ජල බලාගාරයේ සම්පූර්ණයෙන් හොඳ මට්ටමේ තියෙනවා. ඒ සඳහා මෝටර් තමයි මිලදී ගන්න අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අපි ඉක්මණින් ඒ මෝටර් දෙක මිලදී ගෙන සවි කරමු.

ඒ අනුව බිබුල ජල බලාගාරය සඳහා සවි කර ඇති මෝටර අක්‍රිය වීම හේතුවෙන් ඒ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් මත නව මෝටර් දෙකක් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 5 .ටෝනර්, ජල උපකරණ හා විදුලි උපකරණ මිලදී ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටෝනර්, ජල උපකරණ හා විදුලි උපකරණ මිලදී ගැනීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 16/සැපයුම් හා 2022.03. 21 දිනැති ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති පරිදි පහත ද්‍රව්‍ය මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ජල උපකරණ මිලදී ගැනීම

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | 6*1/2 PVC සැඩල් | 05 |
| 02 | 2" Elbow | 10 |

| | | |
|---|---|---|
| 03 | 4" PVC සමන්ධ | 15 |
| 04 | 3" GI Taper Planch | 10 |
| 05 | 4" GI Taper Planch | 05 |
| 06 | 3*3 PVC T Socket | 03 |
| 07 | 2*1/2 PVC T Socket | 05 |
| 08 | 11/4" End Cap | 10 |
| 09 | 1 ½"End cap | 05 |
| 10 | 2" PVC Band | 10 |
| 11 | 1/2" PVC බට | 200 |
| 12 | 1/2" ෆෝසස් කොකට | 500 |
| 13 | ½" වෑල් කොකට | 300 |
| 14 | 1 ½"PVC Bend | 05 |
| 15 | ½" Elbow | 500 |
| 16 | 3" Repair Socket | 05 |
| 17 | 4" Repair Socket | 05 |
| 18 | ½" PVC T Socket | 20 |
| 19 | 2" PVC බට | 50 |
| 20 | 2*1 ½ PVC R Socket | 05 |
| 21 | 1 1/2" PVC සැඩල් | 50 |
| 22 | ගම් බෝතල් | 30 |
| 23 | 1 1/2" එල්බෝ | 10 |
| 24 | 6" Rapair Socket | 03 |
| 25 | 3" PVC බට | 30 |
| 26 | 2* ½ PVC R Socket | 10 |
| 27 | 4*3 PVC R Socket | 05 |
| 28 | 3" PVC සැඩල් | 30 |

| | | |
|---|---|---|
| 29 | 2" PVC සැවල් | 20 |
| 30 | 4" PVC බට | 20 |
| 31 | 3" Rubber Rings | 100 |
| 32. | 1" Trade Seal | 50 |

ලිපි ද්‍රව්‍ය , ලේඛණ හා කම්කරු උපකරණ මිලදී ගැනීම

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ෆොටෝ පේපර් පැකට් | 20 |
| 02 | බයින්ඩින් ටේප් (කප) | 30 |
| 03 | B4 ලීගල් පේපර් පැකට් | 05 |
| 04 | Epson LQ 310 රිබන් | 05 |
| 05 | පරිගණක කඩදාසි 11"*15" | 05 |
| 06 | A3 පේපර් පැකට් | 05 |
| 07 | බොක්ස් ෆයිල් (ලොකු) | 10 |
| 08 | 10"*7" ලියුම් කවර | 1000 |
| 09 | 10"*15" ලියුම් කවර | 1000 |
| 10 | Epson LQ 2090 රිබන් | 10 |
| 11 | කාඩ්බෝඩ් ෆයිල් | 1000 |
| 12 | CR පිටු 80 පොත් | 80 |
| 13 | ලිපි ගිර්ග පොත් | 50 |
| 14 | A4 පැකට් | 100 |
| 15 | ස්ටෙප්ලර් කටු පෙට්ටි 24*6 | 50 |
| 16 | හාප්ෂීට් පැකට් | 100 |
| 17 | 9"*4" ලියුම් කවර | 5000 |

| | | | |
|---|---|---|---|
| 18 | 2" පේපර්වේට් | | 20 |
| 19 | CR පිටු 200 පොත් | | 30 |
| 20 | බැටරි | | 10 |
| 21 | 3 1/2"*6" ලියුම් කවර | | 2000 |
| 22 | CR පිටු 120 පොත් | | 60 |
| 23 | CR පිටු 120 පොත් | | 30 |
| 24 | Samsung 2850 Toner | | 05 |
| 25 | P 1102/85 A Toner | | 05 |
| | HP Laser Jet Pro Toner / 78 A | | 03 |
| 26 | Toshiba P 2309 Toner | | 07 |
| 27 | Calculator | | 05 |
| 28 | Stepler | | 15 |
| 29 | Ficid Note Book | | 50 |
| 30 | විසෙවන් | | 15 |
| 31 | නිල් පෑන් | | 1000 |
| | කළු පෑන් | | 300 |
| | රතු පෑන් | | 200 |
| 32 | Epson ML 664 Ink | කළු පාට | 20 |
| | | නිල් පාට | 10 |
| | | රතු පාට | 10 |
| | | කහ පාට | 10 |
| 33 | මුද්‍රිත ෆයිල් කවර | නිල් පාට | 500 |
| | | දම් පාට | 500 |
| | | තරීස පාට | 300 |
| | | තැඹිලි පාට | 500 |
| | | කොළ පාට | 300 |

| | | |
|---|---|---|
| 34 | ධාවන සටහන් පොත් | 100 |
| 35 | වෙළඳ බලපත්‍ර පොත් | 16 |
| 36 | ලැබෙන ලිපි ලේඛන | 05 |
| 37 | ගොඩනැගිලි සැලසුම් පොත්<br>ගොඩනැගිලි සැලසුම් පොත් ( ලේජර් සහිත) | 100<br>100 |
| 38 | වැය ලේඛන | 06 |
| 39 | බදු කුලී ආදායම් ලේඛන | 05 |
| 40 | ගෙවීම් මුදල් පොත් | 03 |
| 41 | වැටුප් ලේඛන | 03 |
| 42 | වැටුප් විස්තර ලබා දීම ( පොදු 185) පත්‍ර | 1000 |
| 43 | ප්‍රධාන ලෙජර් | 02 |
| 44 | නැමිණීමේ ලේඛන | 10 |
| 45 | තොග ලේඛන | 04 |
| 46 | ප්‍රධාන මුදල් පොත් | 10 |
| 47 | බලපත්‍ර ගාස්තු ලේඛන | 05 |
| 48 | ප්‍රාස 04 වාර්තා පොත් | 05 |
| 49 | ලදු පොත් | 100 |
| 50 | ක්ෂේත්‍රයේදී මුදල් එකතු කිරීමේ පොත් | 100 |
| 51 | ඉන්ධන ඇණවුම් පොත් | 50 |
| 52 | පොළ බිල්පත් පොත් ( වරාපිටිය)<br>පොළ බිල්පත් පොත් (ගොමඩිය)<br>පොළ බිල්පත් පොත් (කටුවන)<br>පොළ බිල්පත් පොත් (කිරම)<br>පොළ බිල්පත් පොත් (කරමැටිය) | 50<br>50<br>50<br>50<br>50 |

| | | |
|---|---|---|
| | පොළ බිල්පත් පොත් (බිද්දෙනිය) | 50 |
| 53 | කණුකොළ මැෂින් තල | 10 |
| 54 | ග්ලාස් ක්ලීනර් | 20 |
| 55 | සැනිටයිසර් | 1001 |
| 56 | සබන් | 300 |
| 57 | ඉදල් | 50 |
| 58 | ලයිසෝල් බෝතල් | 10 |
| 59 | අත් ග්ලව්ස් - දිග | 100 |
| 60 | තොප්පි | 20 |
| 61 | තාලිස් | 20 |

විදුලි උපකරණ ලබා ගැනීම සඳහා

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | විදුලි ලාම්පු වයර් | 25 |
| 02 | වයර් කොයිල් | 50 |
| 03 | කම්බ්ලර් ස්විච් | 200 |
| 04 | 12.5 W Orange LED බල්බ (Trade) | 1000 |
| 05 | 12.5 W Orange LED බල්බ (Pin) | 50 |
| 06 | E 27 සෙරමික් හෝල්ඩර් | 500 |
| 07 | Ilhotocell sensor | 50 |
| 08 | CG හෝල්ඩර්ස් | 50 |

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා

ඉදිරියේදී ලිපි ද්‍රව්‍ය ආදියෙහි මිල ගණන් විශාල වශයෙන් වැඩි වෙයි. ඒත් එක්කම අවශ්‍ය දේවල් හිඟයක් ඇති වෙයි . ඒ නිසා සම දේවල් ඉක්මණින් අරගනිමු.

ඒ අනුව ප්‍රාදේශීය සභාවට අයත් ඉල්ලුම් කර ඇති ටෝනර්, ලිපි ද්‍රව්‍ය, ජල උපකරණ හා විදුලි උපකරණ සඳහා සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-6. කිරම බස් නැවතුම්පොළ බිම් මහලෙහි කඩ කාමර සඳහා සකසන ලද බදු ගිවිසුම හා සංශෝධිත තක්සේරු වාර්තාව</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

කිරම බස් නැවතුම්පොළ බිම් මහලෙහි කඩ කාමර සඳහා සකසන ලද බදු ගිවිසුම හා සංශෝධිත තක්සේරු වාර්තාව සම්බන්ධවයි මෙයෙන් අංක කප්‍රාස 06 හා 2022.03.23 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි එම කඩ කාමර බදු දීම සඳහා සකසන ලද බදු ගිවිසුම හා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති සංශෝධිත තක්සේරු වාර්තාව අනුව ගිවිසුම් ගත වීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සජාන් චින්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

එම කඩ කාමර දෙන අය අපි තෝරා ගෙන තියෙනවා. ඒ අයට ගිවිසුම් ගත වීමට අවශ්‍ය බදු ගිවිසුම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තියෙනවා. ඒත් එක්කම එහි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් මිල ගණන් නැවත තක්සේරුව සඳහා යවා තිබුණත් ඔවුන් නැවතත් ඒ මිල ගණන්ම අනුමත කරලා තියෙනවා. ඒ අනුව තමයි ගිවිසුම් ගත වෙන්න සිදුවෙන්නේ.

ඒ අනුව කිරම බස් නැවතුම්පොළ බිම් මහලෙහි කඩ කාමර බදු දීම සඳහා සකසන ලද බදු ගිවිසුම හා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති සංශෝධිත තක්සේරු වාර්තාව අනුව ගිවිසුම් ගත වීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-7. විපී මත්ස්‍ය අලෙවිකරුවන් සඳහා ජංගම මත්ස්‍ය අලෙවිසැල් ලබා දීම</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

විපී මත්ස්‍ය අලෙවිකරුවන් සඳහා ජංගම මත්ස්‍ය අලෙවිසැල් ලබා දීම සම්බන්ධවයි මෙයෙන් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන , පරිසර කටයුතු , ග්‍රාමීය කර්මාන්ත , විදුලි බල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන ජංගම මත්ස්‍ය වෙළඳ සැල මේ වන කිරම නගරයේ ස්ථාපනය කර ඇති අතර සභාවේ බදු අයකිරීම ක්‍රියාපටිපාටිය අනුව සකස් කරන ලද ගිවිසුම්කාට අනුව ගිවිසුම් ගතව පවත්වා ගෙන යාම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජී.පී.නිශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙය ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ඇතිව අපිට ලැබුණු ජංගම මත්ස්‍ය වෙළඳ සැලක්. මේ සඳහා පෞද්ගලික වෙළඳාම්කරුවෙකු නම් කර ඒ අයට ප්‍රදානයක් යග ඒ සඳහා අවශ්‍ය ජලය, විදුලිය දෙන්න තමයි අවශ්‍ය වෙන්නේ. ඒත් එක්සත් මිළ ලැල්ලකින් යම් මුදලක් අපිට එකතු කරන්න පුළුවන්. පවත්වන දිනකට රු. 100.00 ක් වැනි මුදලක් අය කරන්න පුළුවන්.

ඒ අනුව ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන , පරිසර කටයුතු , ග්‍රාමීය කර්මාන්ත , විදුලි බල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන ජංගම මත්ස්‍ය වෙළඳ සැල මේ වන විට කුරුම නගරයේ ස්ථාපනය කර ඇති අතර සභාවේ බදු අයකිරීම් ක්‍රියාපටිපාටිය අනුව සකස් කරන ලද ගිවිසුමකට අනුව ගිවිසුම් ගතව පවත්වා ගෙන යාම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-08. 2022 අයවැය යටතේ මාර්ග සංවර්ධනය කිරීම</u>**
**<u>ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා.</u>**

වතුකන්ද කොට්ඨාශය සඳහා වෙන් කරන ලද රු.250000.00 ක ප්‍රතිපාදන මඟින් රක්මල්පිටිය පණුවන්කැලය මාර්ගය සංවර්ධනය කර තියෙනවා. ඉතිරි මුදලින් වැහැන්න මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරඹගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව වතුකන්ද කොට්ඨාශය සඳහා වෙන් කරන ලද රු.250000.00 ක ප්‍රතිපාදන මඟින් රක්මල්පිටිය පණුවන්කැලය මාර්ගය සංවර්ධනය කොට ඉතිරි මුදලින් ඇස්තමේන්තු සකස් කර වැහැන්න මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-09. කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන අපහරණය සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන අපහරණය සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස /18/වාහන හා 2072.03.23 දිනැති ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති පරිදි ධාවනයෙන් ඉවත් කරන ලද කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන අතරින්

- 53- 5716 කැබ් රථය තක්සේරු මණ්ඩල නිර්දේශයන් හා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ උපදෙස් හා නියමයන් අනුව අපහරණ කටයුතු සිදු කිරීමක්

- AHT – 8 ඇලිමෙටක් අත් ට්‍රැක්ටරය හා K -75 කුඹෝටා අත් ට්‍රැක්ටරය මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව අපහරණ කටයුතු සිදු කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රාදේශීය සභාව සතු වාහන අතරින්

- 53- 5716 කැබ් රථය සමීක්ෂණ මණ්ඩල නිර්දේශයන් හා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් හා නියමයන් අනුව අපහරණ කටයුතු සිදු කිරීමත්

- AHT 8 ඇලිමෙටක් අත් ට්‍රැක්ටරය හා K -75 කුඹෝටා අත් ට්‍රැක්ටරය මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව අපහරණ කටයුතු සිදු කිරීමත්

සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-10. කටුවන පරණ පොළ ගොඩනැගිල්ල ඉවත් කිරීමේ ඇස්තමේන්තුව අනුමත කිරීම</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

කටුවන පරණ පොළ කඩ කාමර ඉවත් කිරීම සඳහා තාක්ෂණ නිළධාරී විසින් සකස් කරන ලද රු. 412476.38 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත් ඒ අනුව එම කඩ කාමර කඩිනමින් ඉවත් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ ගොඩනැගිල්ල දැනට ප්‍රයෝජනයට ගන්නේ නැහැ. මේ ගොඩනැගිල්ල ඉවත් කිරීමේදී යකඩ ආදිය එම ක්‍රමවේදයන්ට අනුව ඉවත් කළ යුතු නිසා ඇස්තමේන්තුවක් හදලා කොන්ත්‍රාත්කරුවෙකුට භාර දෙනවා. පසුව වෙන්දේසි කළ යුතු දේවල් සභාවට භාර ගෙන වෙන්දේසි කරමු.

ඒ අනුව කටුවන පරණ පොළ කඩ කාමර ඉවත් කිරීම සඳහා තාක්ෂණ නිළධාරී විසින් සකස් කරන ලද රු. 412476.38 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත් ඒ අනුව එම කඩ කාමර කඩිනමින් ඉවත් කිරීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-11. ජල බිල්පත් මෘදුකාංගයෙහි සංශෝධන සකස් කිරීම</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ජල බිල්පත් මෘදුකාංගයෙහි සංශෝධන සකස් කිරීම මැයෙන් වයඹ සංවර්ධන අධිකාරිය මගින් ඉදිරිපත් කර ඇති අංක Wda/ T & D /Soft /CAT / -2020 KATUWANA PS හා 2022.03.21 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි අප ආයතනය විසින් මිලදී ගෙන ඇති CAT 2020 මෘදුකාංගය ආයතනයට අවශ්‍ය පරිදි නැවත සකස් කිරීම වෙනුවෙන් රු. 115000.00 ක මුදලක් වැය වන බව එම ආයතනය විසින් දන්වා ඇත. ඒ අනුව එම මුදල් සභා අරමුදලින් ගෙවා එම මෘදුකාංග පද්ධතිය ආයතනික අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකස් කර ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ ආයතනය මගින් සකස් කරලා තියෙන පොදු ආකෘතිය අපේ ජල බිල්පත් වල තියන ආකෘතිය හා වෙනස් නිසා එය අපට අවශ්‍ය පරිදි සකස් කරන්න තමයි මේ අමතර ගෙවීම කරන්න වෙන්නේ.

ඒ අනුව අප ආයතනය විසින් මිලදී ගෙන ඇති CAT 2020 මෘදුකාංගය ආයතනයට අවශ්‍ය පරිදි නැවත සකස් කිරීම වෙනුවෙන් රු. 115000.00 ක මුදලක් සභා අරමුදලින් ගෙවා එම මෘදුකාංග පද්ධතිය සකස් කර ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-12. නඩු ගාස්තු සම්බන්ධවයි</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

නඩු ගාස්තු සම්බන්ධවයි මැයෙන් නීතිඥ හා නොතාරිස් වීරසිංහ දයාරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාව විසින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් කෝරළගේ මව්ලිස් යන අයට එරෙහිව පවරන ලද නඩුව සඳහා පහත පරිදි නඩු ගාස්තු අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

නඩුව ගොනු කිරීම ( ලේඛන සමග)- රු. 10000.00

නඩු වාරයක් සඳහා පෙනී සිටීමේ ගාස්තු - රු. 2000.00

යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

අපි මේ ඉදිකිරීම නතර කළාද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි මේක නතර කළා. අනවසර ඉදිකිරීමක් නිසා . ඒ අය සභාව සහ නිලධාරීන් නැල්ලවට ලක් කරලා කටයුතු කරනවා නම් අපි මෙය පූර්වාදර්ශයක් වීමට ඉඩ නොදී නීති මාර්ගයෙන් කටයුතු කළ යුතුයි. අපිට මේ ගාස්තු අය කිරීම සම්බන්ධව ගැටළුවක් තියෙනවද?

<u>ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා.</u>

දැනට නීතිඥ ගාස්තු සම්බන්ධ ගැසට් එකක් නිකුත් කරලා තියෙනවා. මෙහෙත් එහෙම ගැසට් එකක් තිබුණේ නැහැ. දළ වශයෙන් කාඩ්පත් පවරන ගාස්තුව රු. 30000.00 ක් ලෙස නියම කරලා තියෙනවා. ඒ නිසා මේ ගාස්තු ගැටළුවක් නැහැ.

<u>ගරු ප්‍රා.ස.ම. ජේ.ඒච් චන්ද්‍රසේන මැතිතුමා,</u>

අනවසර ඉදිකිරීම් සම්බන්ධ ගැටළු ඕන තරම් තියෙනවා. ඒ සඳහා නිලධාරීන් තමන්ගේ රාජකාරිය හරියට ඉටු කළ යුතුයි. එහෙම වුණොත් ඒ අය හැල්ලුවට ලක් වෙන්නේ නැහැ.

ඒ අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අදාළව කෝරළයේ මහලිස් යන අයට එරෙහිව පවරන ලද නඩුව සඳහා පහත පරිදි එනම්:

නඩුව පැවරීම ( අල්වන සමග)- රු. 10000.00

නඩු වාරයක් සඳහා පෙනී සිටීමේ ගාස්තු - රු. 2000.00 වශයෙන් නඩු ගාස්තු අය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-13. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා,</u>

වරාපිටිය, රමමල, පැරකුම් ශෝඩි සංවිධානය විසින් 2022.02.11 දිනැතිව සිදු කර ඇති ඉල්ලීම අනුව ගෙදියන්දර - ඌරුබොක්ක මාර්ගයේ හඳුගල හංදියේ සිට වරාපිටිය ජාතික පාසල දක්වා කි.මී.2ක කොටස පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගන්නා ලෙස ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් වලස්මුල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යවා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලුම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා,</u>

අපි මේ ඉල්ලීම අනුමත කරලා වලස්මුල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යවමු.

ඒ අනුව ගෙදියන්දර - ඌරුබොක්ක මාර්ගයේ හඳුගල හංදියේ සිට වරාපිටිය ජාතික පාසල දක්වා කි.මී.2ක කොටස පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගැනීම සම්බන්ධයෙන් වලස්මුල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යවා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලුම් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-14. අතිකාල හා ගමන් වියදම් දීමනා සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා,</u>

අතිකාල හා ගමන් වියදම් දීමනා සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 02 හා 2022.03.22 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් රැකියා දසලක්ෂය වැඩසටහන යටතේ මෙම කාර්යාලය වෙත අනුයුක්ත කරන ලද පහත සේවකයින් රාජකාරි

අවශ්‍යතාවය මත රාජකාරි වේලාවට පරිබාහිරව හා සති අන්ත දිනවල සේවය යෙදවීම වෙනුවෙන් මසකට උපරිම පැය 40ක් දක්වා අතිකාල දීමනාවක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

01.එච්.එම්. ජේනක ඉෂර්ෂාන් - රියදුරු

02. ඩබ්. පුමින්ද රාමණායක - රියදුරු

ගරු ප්‍රා.ස.මන්ත්‍රී මාහෙල් දිසානායක මැතිනිය යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම සේවකයින් දෙදෙනා රාජකාරි වේලාවට පරිබාහිරවත් සති අන්ත දිනවලත් අපි සභාවේ කටයුතු සඳහා යොදා ගන්නවා. ඒ සඳහා අපි ගෙවීමක් කරමු. ඒ අයට අපේ ආයතනයෙන් වැටුප් ගෙවන්නේ නැහැ.

ඒ අනුව ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් රැකියා දසලක්ෂය වැඩසටහන යටතේ මෙම කාර්යාලය වෙත රියදුරු රාජකාරිය සඳහා අනුයුක්ත කරන ලද සේවකයින් දෙදෙනා රාජකාරි අවශ්‍යතාවය මත රාජකාරි වේලාවට පරිබාහිරව හා සති අන්ත දිනවල සේවය යෙදවීම වෙනුවෙන් මසකට උපරිම පැය 40ක් දක්වා අතිකාල දීමනාවක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>08-15. වවුචර් සඳහා ගෙවීම් කිරීම</u>
<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

01.වවුචර් අංක 247- ප්‍රබුද්ධ ගොවි සංවිධානය, රත්මල්පිටිය, කටුවන - රත්මල් පිටිය ප්‍රජා ශාලාව අසළ සිට පනුවන්කැටය හරහා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.105270.40 ( 10% රඳවුම - 10527.04 + ගෙවන මුදල - රු. 94743.36)

02.වවුචර් අංක 239- ගැමුණු ගොවි සංවිධානය, රණසිංහගොඩ, කටුවන - රණසිංහගොඩ 18 කණුව පුහුල්හේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම රු. 164486.47( 10% රඳවුම- 16448.64 + ගෙවන මුදල - රු. 148037.83)

03. වවුචර් අංක 242 - මුදල් භාරකරු, ප්‍රාදේශීය සභාව , මිද්දෙනිය - කිරම බස් නැවතුම්පොළ විවෘත කිරීමට අදාල පූර්ව සූදානම් කටයුතු හා උත්සව කටයුතු සඳහා ලබා ගන්නා ලද අග්‍රිමකාරම මුදල් පියවීම - රු. 35825.00

04.වවුචර් අංකය 248 - සාමාන්‍යාධිකාරී,කි/ස විවිධ සේවා සමුපකාර සමිතිය,වීරකැටිය - 2022.03.01 සිට 2022.03.15 දක්වා කාලවක ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා ඉන්ධන සැපයීම -රු. 338485.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී කල්පෙගමගේ මැතිනිය යෝජනාව ස්ථිර කරන ලදී. මෙම වවුචර සඳහා ගෙවීම් කරමු.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් නොවූ වවුචර් කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-16. ඇස්තමේන්තු සංශෝධනය කිරීම**
**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එෆ්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා.**

මිද්දෙනිය ජන උදාන ගම්මානයේ මාර්ගයක සෝදා පාළුවට ලක් වූ ස්ථානය සඳහා පැති බැම්මක් ඉදිකර දීමට 2021 වර්ෂයේ සභා අරමුදලින් ප්‍රතිපාදන වෙන් කරන ලද අතර රට තුළ පැවති සිමෙන්ති හිඟය හේතු කර ගෙන ඒ සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වුණා. ඒත් එක්කම වර්තමානය වන විට වෙළඳ පොළ ගොඩනැගිලි ද්‍රව්‍ය මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් එම ඇස්තමේන්තුව පවතින මිල අනුපාත අනුව නැවත සංශෝධනය කර සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඊ.බී.ඉන්දික මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

නව මිල අනුපාතයන්ට අනුව ඇස්තමේන්තුව හදන්න වෙනවා. ඒ සඳහා දිස්ත්‍රික් මිල කමිටුව මගින් මිල අනුපාත ඉදිරිපත් කිරීමෙන් පසුව ඇස්තමේන්තුව සංශෝධනය කරමු.

ඒ අනුව මිද්දෙනිය ජන උදාන ගම්මානයේ මාර්ගයක සෝදා පාළුවට ලක් වූ ස්ථානය සඳහා පැති බැම්මක් ඉදිකිරීමට සකස් කරන ලද ඇස්තමේන්තුව 2022 වර්ෂය සඳහා දිස්ත්‍රික් මිල කමිටුව මගින් නව මිල අනුපාතයන් වෙනස් කළ පසු වෙන්කර ඇති ප්‍රතිපාදනයන්ට යටත්ව නැවත සංශෝධනය කර සකස් කරදීම සම්බන්ධවත් ඒ අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-17. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම එම්.ජයන්ත මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. එම්.ජයන්ත මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-18. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයක් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. පුගත් සරම්ගේ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-19. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම යූ.ජී.ධර්මසිරි මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයක් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමාට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. මාහෙල් දිසානායක මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-20. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ටී.බී.ඉන්දිකා මැතිතුමිය**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයක් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ටී.බී.ඉන්දිකා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඩී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ගරු ප්‍රා.ස.ම. පුගත් සරම්ගේ මැතිතුමන් විසින් පසුගිය දිනක ඉදිරිපත් කරන ලද මාර්ගයක් සම්බන්ධව ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා අපි සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර එම වාර්තාව සභාව වෙත ඉදිරිපත් කර තිබෙනවා. එය නියෝජනය කළ මන්ත්‍රීතුමන්ලාට යම් පැහැදිලි කිරීමක් සිදු කරන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා**

අපි කමිටුවක් විදියට මෙම ස්ථානය පරීක්ෂණය සඳහා ගියා. එහිදී මෙම ඉඩම කැබලි අංක 07 නැවත බෙදිලා තමයි අනෙකාට දීලා තියෙනවා. ඒ සඳහා එන මාර්ගය පෞද්ගලික ඉඩමකින් තමයි දීලා තියෙන්නේ. මේ සඳහා අපිට නිර්දේශ දෙන්න පුළුවන් කමක් නැහැ. අපි වාර්තාවක් ලබා දීලා තියෙනවා. මේ සඳහා නීති මාර්ගයෙන් තමයි කටයුතු කරන්න වෙන්නේ.

**ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා.**

මෙම ඉඩම අපි නිරීක්ෂණය කළා. මෙය බෙදුම් නඩුවකින් කැබලි වෙච්ච ඉඩමක්. අංක 09 කියලා මාර්ගයක් මගින් මෙම අංක 07 කැබැල්ල වෙත ප්‍රවේශ වෙන්න පාරක් වෙන් කරලා තියෙනවා. මෙම ප්‍රවේශය ඉතා අපහසු මාර්ගයක් . එය මැනුම් කරපු මිනින්දෝරු මහතා නිවැරදිව කරලා නැති බව තමයි පෙනී යන්නේ. මේ සඳහා 66 වගන්තියෙන් වගේ නඩුවක් දමනවා නම් දැනට පවතින මාර්ගය ගන්න පුළුවන් වෙයි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඒ කියන්නේ අපේ කාන්තා නිලධාරී මහත්ම ඔබ සඳහා ලබා දුන් ඩාර්කාවන් ඔබ සමග ගැලපෙනවා නේද?

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරඹගේ මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අපේ උගත් හා බුද්ධිමත් මන්ත්‍රීතුමන්ලා මේ ගැටළුව පිසදලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ ඒක. නිලධාරීතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නෙත් ඒක. නිලධාරී තුමන් දුන් වාර්තාව හා අපි වාර්තාවේ යම් පරස්පරතාවයක් තියෙනවා. නමුත් ඔබතුමන්ලා අපි සිද්ධිය සහාය ලෙස වාර්තා කිරීම සම්බන්ධව මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ජේ.චන්ද්‍රලතා මැතිතුමියගේ අභාවයත් සමග පුරප්පාඩු වූ මන්ත්‍රී ධූරය වෙනුවෙන් නවක මන්ත්‍රීතුමියක් වන කේ.කේ.ජී. සුගතිත්‍රා මැතිතුමිය අද දින දිවුරුම් දුන්නා. එතුමියට සුබ පතන ගමන්ම ඔබ සියලු දෙනාගෙන්ම සුභාශිංසන එකතු කරන ලෙස ආරාධනා කරනවා.

ඊත් එක්කම මම මතක් කරනවා අද රටේ තත්වය එක්ක ඉන්ධන භාවිතය ආදිය අරපිරිමැස්මෙන් භාවිතා කරන්න කියලා සියලු දෙනා දැනුවත් කරන්න කියලා, අපේ වියදම් අවම කරගන්න හැකි පමණ කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. 2022 මාර්තු මස මහ සභාව පවත්වනු ලබන මේ මොහොතේ මම කියන්න කැමතියි අපේ කට්ටුවන ප්‍රාදේශීය සභාව අනෙකුත් සභා වල පවා ආදර්ශයක් කර හැකිමට කරා කළ අවස්ථා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමන් ගන්නා හොඳ තීන්දු තීරණ සඳහා අපි එකඟ වෙනවා. ඊත් එක්කම මේ දිනවල ජාතික ප්‍රතිපත්තියක් ලෙස විදි පහන් එළිය නොනිවීමට තීරණය කළත් ඇතැම් සභා වල ප්‍රදේශ වල මෙය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. තිහගොඩ, හක්මණ ආදි ප්‍රාදේශිය සභාවන් වල මෙය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එය ජාතික ප්‍රශ්නයට උර දීමක් ලෙස එසේ සිදු කළත් එයින් අපේ ප්‍රදේශ වල ඇතැම් කර්මාන්ත වලට සහ අය යම් දුෂ්කරතාවයන්ට මුහුණ පානවා. ඒ නිසා මේ පිළිබඳ තව දුරටත් සිතා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

අනෙක් කාරණය ලෙස මිද්දෙනිය පොළ-දැල් ආවරණයත් සමග වහලටම විශාල වශයෙන් ගස් වැඩිලා පොළ නොපෙනෙන තරමට වල් බිහිවෙලා තියෙනවා. පොළ වහල පැත්ත ජරා ජීර්ණ තත්වයට ඇවිත්. මේ පිළිබඳ අවධානය යොමු කරලා පොළ අයිත්කරණ නිලධාරීන් මගින් හෝ වෙන කම්කරුවන් යොදවලා මෙම ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන්න කියලා ඉල්ලීම කරනවා. ඊත් එක්කම මිද්දෙනිය සති පොළ බෝඩ් එක සවි කිරීම තවම සිදුකරලා නැහැ.

ඊළඟ කාරණය ලෙස සභා වාර කීපයකම කථා කරන ලද මිද්දෙනිය නගරයේ සවි කර ඇති ඩිජිටල් නාම පුවරු ඉවත් කිරීම තවමත් සිදු කරලා නැහැ. ඊත් එක්කම වීරකැටිය උයමෙන් සිට පනාමුර පාරට දිවෙන මාර්ගය පිරවුම් පොළ සහ පාර හැට්ටක් සහිත බැවින් කොන්ක්‍රීට් දමලා සකස් කරලා දෙන්න කියලා ඉල්ලීම කරනවා. එහෙත අනතුරු සිදුවන ප්‍රමාණය වැඩියි. ඊත් එක්කම එම මාර්ගයෙහි වාහන අවහිර වීමත් සිදුවන නිසා ත්‍රීරෝද රථ හා යතුරු පැදි පමණක් ගමන් අවසරය ලබා දෙනවා නම් හොඳයි. ඒ සම්බන්ධයෙන් දැන්වීම් පුවරුවක් එක් දාලා එවැනි සීමාවක් දමමු.

සභාපතිතුමනි, අවසාන වශයෙන් අපගේ නවක මන්ත්‍රීතුමියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උණුසුම් සුබ පැතුම් එකතු කරන ගමන්ම සභාවේ කටයුතු කර ගෙන යාමට ගරු සභාපතිතුමන්ට ඔබතුමියගේ සක්‍රිය දායකත්වය ලබා දෙන්න යයි ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය පොළ පිරිසිදු කිරීම අපි කඩිනමින් කරමු. ඒ සඳහා සේවකයින් යොදවලා ඒ කාර්යය කරවන්නම්. මිද්දෙනිය නගරයේ සුවිසර ඇති ඩිජිටල් නාම පුවරු ඒ අය කරගෙන සහායනවා නම් අපි ඉවත් කරමු.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.බී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අද දින සභාවේ පුරප්පාඩු වූ මන්ත්‍රීධූරය සඳහා අලුත් ගත්තා ලද මන්ත්‍රීතුමියට අපගේ සුභ පැතුම් එකතු කරනවා. ගරු සභාපතිතුමන්ට හා සභාවට සහයෝගය දක්වමින් ඉදිරි කටයුතු කර ගෙන යාමට ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. නවක මන්ත්‍රීතුමියට සුභ පැතුම් එකතු කරන ගමන්ම එතුමිය ප්‍රාදේශීය සභාවේ සංවර්ධන කටයුතු සඳහා සහයෝගය දක්වමින් අප සමග එක්ව කටයුතු කරාවි යයි අපේක්ෂා කරනු ලබනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.කේ.පී.සුනේත්‍රා මැතිතුමිය</u>

ගරු සභාපතිතුමන් ඇතුළු සියලුම දෙනාගෙන් අවසරයි. මම මෙම මන්ත්‍රී ධූරය සඳහා තේරී පත් වූයේ ගරු ප්‍රා.ස.ම. ජේ. චන්ද්‍රලතා මැතිතුමියගේ හදිසි මරණය හේතුවෙන් මෙම ධූරය පුරප්පාඩු වීම නිසා. මුලින්ම මම එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒත් එක්කම මම මෙම ධූරය සඳහා තෝරා පත් කරනු ලැබූ එක්සත් ජාතික පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට, ගරු ආනන්ද කුලරත්න මැතිතුමන්ට ස්තූති වන්ත වෙනවා. එත් එක්කම මට හැකි අයුරින් සභාවේ කටයුතු කරගෙන යාමට ගරු සභාපතිතුමන්ට, උප සභාපතිතුමන්ට, විපක්ෂනායක තුමන්ට සහාය වන බව ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

සියලු දෙනාගෙන්ම අවසරයි. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හැටියටත් කඩුවන ප්‍රාදේශීය සභාවේ බලය හොබවන පක්ෂය හැටියටත් අද දින දිවුරුම් දුන් නවක මන්ත්‍රීතුමියට සුභ පැතුම් එකතු කරන ගමන්ම එතුමිය අපගේ කටයුතු සඳහා සහයෝගය ලබාදෙමින් කටයුතු කරාවි යයි අපේක්ෂා කරනු ලබනවා. එතුමියට එම කටයුතු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනු ලබනවා.

## <u>10. - ස්තූතිය හා නිමාව,</u>

අද දින 2022 වර්ෂයේ මාර්තු මස මහ සභා රැස්වීම සඳහා පැමිණ-එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූන හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා-තුමියන්ලා සහ ලේකම්තුමා, නිලධාරීතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා සභිකයෝ සතුටින් විසිර ගියහ.

අයි.ජී.මහින්ද
සභාපති
කඩුවන ප්‍රාදේශීය සභාව
සභාපති,
කඩුවන ප්‍රාදේශීය සභාව,
මිද්දෙනිය.